# වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුව

# වෙන්නප්පුව ප්‍රාදේශිය සභාව

## <u>2026 වර්ෂයේ/ 09 වන සභා වාරයේ මහා සභා රැස්වීම් වාර්ථාව</u>

## <u>2026.01.13</u>

<u>පැමිණීම</u>

1. ගරු සභාපති ටී.බී.ඩී ඇන්ටනී කුමාර් මයා
2. ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා
3. ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා
4. ගරු මන්ත්‍රී බී. ඇන්ටනී සුනිල් සාන්ත පෙරේරා මයා
5. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ආර්.ෂවීන් ප්‍රනාන්දු මයා
6. ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය
7. ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය
8. ගරු මන්ත්‍රී ජී.ලලිත් ඔස්කා පෙරේරා මයා
9. ගරු මන්ත්‍රී කේ.ඩිලාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මයා
10. ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මයා
11. ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා
12. ගරු මන්ත්‍රිනී වයි.ටෙක්ලා ජයම්පති විජේසේකර මිය
13. ගරු මන්ත්‍රී සී.ජූඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මයා
14. ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මයා
15. ගරු මන්ත්‍රී ජී.එම්.සඳුන් මධුමාල් ගම්පහ මයා
16. ගරු මන්ත්‍රී ආර්.එම්.අජිත් උදයසිරි රණතුංග මයා
17. ගරු මන්ත්‍රී කේ.එල්.සමන් රෝහිත මයා
18. ගරු මන්ත්‍රිනී එල්.ජයංගා රුවනාරි ප්‍රනාන්දු මිය
19. ගරු මන්ත්‍රිනී පී.කේ.හසංකා සෙව්වන්දි දයාරත්න මිය
20. ගරු මන්ත්‍රී එම්.සුරංගා රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා
21. ගරු මන්ත්‍රී ජගත් කීර්ති කුමාර අබේරත්න මයා
22. ගරු මන්ත්‍රිනී ඒ.එම්.මනෝරි එරන්දති මිය
23. ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මයා
24. ගරු මන්ත්‍රී කේ.අජිත් නිශාන්ත ප්‍රනාන්දු මයා
25. ගරු මන්ත්‍රී ඒ.ඒ.චොහාන් සන්දීප් මයා
26. ගරු මන්ත්‍රී කේ.එල්.ඩී.ජී.සංජය අප්පුහාමි මයා
27. ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවිය

28. ගරු මන්ත්‍රී ඒ.එච්.ගාමිණී රෙක්ස් ප්‍රනාන්දු මයා
29. ගරු මන්ත්‍රී ඩබ්.දිනේෂ් සංජීව ප්‍රනාන්දු මයා
30. ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මයා
31. ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා
32. ගරු මන්ත්‍රී ජේ.පී.උපාලි සඳසිරි මයා
33. ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මයා
34. ගරු මන්ත්‍රිනී කේ.ඒ.ඩී.ශ්‍රීමාලි ඉන්ග්‍රීට් මිය
35. ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය
36. ගරු මන්ත්‍රිනී ආර්.පී.මෙලනි චතුරිකා රන්තිලක මිය
37. ගරු මන්ත්‍රී සුධීර ප්‍රදීප් රණසිංහ මයා
38. ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මයා
39. ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මයා
40. ගරු මන්ත්‍රී ඩබ්.විමලසිරි පෙරේරා මයා

<u>නොපැමිණි මන්ත්‍රීවරුන්</u>

1. ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මයා
2. ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා
3. ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා
4. ගරු මන්ත්‍රී ඒ.ඒ. විමුක්ත් සුසන්ත අප්පුහාමි මයා

මෙදින පෙ.ව 9.00ට මහ සභා රැස්වීමේ කටයුතු ගරු සභාපති ටී.බී.ඩී. ඇන්ටනී කුමාර් මහතාගේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීම් ශාලාවේදී ආරම්භ විය.

**1. 2025.12.16 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම.**

2025.12.16 දිනැති මහ සභා වාර්තාව සත්‍යයක් බව ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මහතා විසින් යෝජනා කල අතර එම යෝජනාව පහත සඳහන් සංශෝධන වලට යටත්ව ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මයා විසින් ස්ථිර කිරීමෙන් පසු සභා සම්මත විය.

**2025.11.11 දින පැවති මහ සභා රැස්වීම් වාර්ථාවේ සංශෝධන :-**

<u>පිටු අංක 13</u>

ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මහතා ඇතුළු ප්‍රදේශවාසී සියලු දෙනා ගංවතුරෙන් පීඩාවට පත් වූ මොහොතේ ගොඩැල්ල දේවස්ථානයට ලබා දුන් ජල බවුසරය ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවිය විසින් ජනතාවට ලබා දුන් බව මහ සභා වාර්ථාවේ සඳහන් වුවත් ගොඩැල්ල, ගෝනවිල දේවස්ථානයට ලබා දුන් ජල බවුසරය එතැන නවතා එතුමිය විසින් පෞද්ගලිකව ජල බවුසරයක් ලබා දුන් බව පැවසූ බවට සංශෝධනය විය යුතු බව පවසන ලදි.

<u>පිටු අංක 09</u>

පෙදරේරුවෙකුට පවා රු.3000-3500ක් ගෙවන බව වාර්ථාවේ සඳහන් වී ඇති නමුත් එය පෙදරේරුවෙකුට නොව පෙදරේරු සහයෙකුගේ වැටුප ලෙස සංශෝධනය විය යුතු බව ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා විසින් පවසන ලදි.

<u>පිටු අංක 23</u>

ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මහතා විසින් ඉදිරිපත් කල සෝලා ක්‍රමයට අදාල යෝජනාව දීර්ඝ කලක් සිට ඉදිරිපත් කලත් එය අදාල කාරක සභාව වෙත යොමු වී නොමැති නිසා ඊලඟ කාරක සභාවට යොමු කරන බව ගරු සභාපතිතුමා පැවසූ අතර එම සංවාදය මහ සභා වාර්ථාවේ සටහන් වී නොමැති බව පවසන ලදි. ඒ අනුව එය සංශෝධනය විය යුතු බව පවසන ලදි.

<u>පිටු අංක 24</u>

ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මහතා පවසා සිටියේ මහ සභා වාර්ථාවේ සඳහන් වී ඇති අදහස වෙනස් බවයි.ආපදා කළමනාකරණයේ දුර්වලතාවයක් පෙන්වා දුන් අතර ගංවතුර සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමට හැකියාව තිබුනත් එය කිරීමට අපොහොසත් වූ බව පැවසූ බවට සංශෝධනය විය යුතු බව පවසන ලදි.

**2. ගරු සභාපති තුමාගේ විශේෂ නිවේදන.**

i. ගත වූ 2025 වසර තුල සභාවේ වැඩකටයුතු සාර්ථක කර ගැනීම සඳහා සහයෝගය ලබා දුන් ගරු උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය වෙත ස්තූතිය පුද කර සිටිමි.

ii. 2025 වර්ෂය අවසානයේදි ඇති වූ ආපදා තත්වය මත සභාව මඟින් ක්‍රියාත්මක කල යුතු වැඩසටහන් වල ප්‍රමාදයක් සිදු වී ඇත. ප්‍රමාද වී පවතින එම කටයුතු යථාවත් කිරීම සඳහා කඩිනමින් පියවර ගනිමි.

iii. 2026 අයවැය ලේඛනයේ පිටපත් ලබා දී ඇති අතර එම අයවැය ලේඛනයෙන් අපේක්ෂා කරන ඉලක්ක ලඟා කර ගැනීම සඳහා ඔබ සියලුම දෙනාගේ සහයෝගය අපේක්ෂා කරමි.

**3. පෙත්සම්, පැමිණිලි හා ලිපි ඉදිරිපත් කිරීම.**

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා

i. **මොහොට්ටුමුල්ල විහාරස්ථානාධිපති ශාස්ත්‍රපති ගොඩිගමුවේ සීවලි ස්ථවිර හිමි ඉල්ලුම්කල ආධාර ලිපිය.** S.A.R.A. ජයාන්නද මහතා ශ්‍රී වර්ධනාරාම විහාරාධිපති හිමි කල ආධාර නොලැබීම මත එය සොයා ලැබීමට ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා හට කල ඉල්ලීම් ලිපිය.

ii. ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා විසින් මහ සභාව ගනු ලැබීමට යන වැරදි අනුමැකියට විරුද්ධව එය අත්හිටුවීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාට කල ඉල්ලීම් ලිපිය.

iii. ඉහත කරුණු සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාට කල ඉල්ලීම් ලිපිය

iv. ඉහත කරුණු සම්බන්ධයෙන් මහ සභා අනුමැතිය අත්හිටුවන ලෙස ලේකම්තුමාට කල ඉල්ලීම් ලිපිය

v. විහාරස්ථානාධිපති ශාස්ත්‍රපති ගොඩිගමුවේ සීවලි ස්ථවිර හිමියන් විසින් කල ඉල්ලීම් ලිපියේ පිටපත.

vi. ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මයා දෙවනුව කල ඉල්ලීම් ලිපිය.

vii. S.A.R.A. ජයාන්නද මහතා ලියාපදිංචි තැපැල මගින් ගරු සභාපතිතුමාගෙන් ප්‍රමාදය පිලිබඳ විමසු ලිපිය.

viii. S.A.R.A. ජයාන්නද මහතා ලියාපදිංචි තැපැල මගින් ලේකම්තුමාගෙන් ප්‍රමාදය පිලිබඳ විමසු ලිපිය.

ix. ඉහත සිද්ධිය සම්බන්ධයෙන් කරුණු විමසා ප්‍රජා සංවර්ධන නිලධාරි වෙත ලේකම් තුමා මගින් යොමු කරන ලිපිය.

x. ගරු වයඹ පලාත් කොමසාරිස් තුමා වෙත කරුණු දැනගැනීම සඳහා දැනුම් දීමක් වශයෙන් යවන ලිපියේ පිටපත

xi. මාර්ගය සභාවට පවරා ගැනීම සම්බන්ධව ගරු සභාපතිතුමාගේ අවධානය පිණිස යොමු කල ලිපිය

xii. අදාල කාර්මික සේවා කාරක සභාව වෙත යොමු කර ගන්නා ලිපිය

xiii. නිවැසියන්ගේ තොරතුරු සහිත ඉල්ලීම් ලිපිය නැවත ඉදිරිපත් කිරීම.

xiv. සභාවට පවරා ගන්නා ලෙස කල ඉල්ලීම් ලිපිය

xv. ප්‍රාදේශිය සභාවේ ලේකම් තුමා මගින් තාක්ෂණික නිලධාරි තුමියගෙන් ඉල්ලීම් කල ලිපිය

xvi. තොරතුරු දැන ගැනමේ පණත යටතේ කල ඉල්ලීමේ පිටපත

**4. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා

i. 2025 වර්ෂයේ බදු ගත් වෙන්නප්පුව සතිපොළ සඳහා වෙළඳ සංගමයෙන් වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවට කොපමණ මුදලක් ගෙවීමට තිබේද? එහි වර්තමාන තත්වය කෙසේද?

- වෙන්නප්පුව වෙළඳ සංගමය විසින් 2025 වර්ෂයට බදු ගෙන තිබූ වෙන්නප්පුව සතිපොළ සඳහා ගිවිසුම් ප්‍රකාරව ගෙවීමට තිබූ මුදල රු13,059,000.00කි. මේ වන විට ගෙවා ඇති මුදල රු.9,434,851.92කි. ඒ අනුව ගෙවීමට ඇති ඉතිරි කුලී මුදල රු.3,624,148.08කි. ගෙවීමට ඇති ඉතිරි දඩ මුදල රු.261,180.00කි.

- අධිකරණයේ තීරණයට අනුව ඔක්තෝම්බර්,නොවැම්බර්, දෙසැම්බර් මාසවල එකතු කරන ලද කුලියෙන් සභාවට ගෙවිය යුතු මුදල මෙතෙක් ගෙවා නොමැත. මීළඟ නඩු දිනය 2026.01.21 දින වේ. නඩුව සමතයකට පත් කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. 2026.01.01 දින සිට සභාවේ නිලධාරින් ගාස්තු අය කරනු ලැබේ. පළමු සතියේ ආදායම රු.266,650.0කි. පහත සඳහන් කඩවල තක්සේරු මුදල අය කර ගැනීමට නොහැකිව ඇත.

| කඩය | තක්සේරු ගාස්තුව | දැනට අය කරන මුදල | | | |
|---|---|---|---|---|---|
| A ගොඩනැගිල්ලේ රෙදි කඩ | 3000.00 | 2000.00 | | | |
| B ගොඩනැගිල්ලේ රෙදි කඩ | 1500.00 | 800.00 | | | |
| C ගොඩනැගිල්ලේ කඩ 15*13 | 3200.00 | 800.00 | 1400.00 | 1800.00 | 2000.00 |
| C ගොඩනැගිල්ලේ කඩ 15*6 | 1600.00 | 800.00 | 1200.00 | 1600.00 | |
| D ගොඩනැගිල්ලේ කඩ 15*13 | 3200.00 | 800.00 | 1400.00 | 1800.00 | 2000.00 |
| D ගොඩනැගිල්ලේ කඩ 15*6 | 1600.00 | 800.00 | 1200.00 | 1600.00 | |
| E ගොඩනැගිල්ලේ කඩ 15*13 | 3200.00 | 800.00 | 1400.00 | 1800.00 | 2000.00 |
| E ගොඩනැගිල්ලේ කඩ 15*6 | 1600.00 | 800.00 | 1200.00 | 1600.00 | |
| F ගොඩනැගිල්ලේ කඩ 15*13 | 2600.00 | 1500.00 | | | |
| F ගොඩනැගිල්ලේ කඩ 15*6 | 1300.00 | 500.00 | | | |

## 5. යථා පරිදි කල් දී ඇති යෝජනා

1) සේවා ගිවිසුම් පදනම මත සේවයේ යෙදී සිටින සේවකයින්ගේ සේවා කාලය දීර්ඝ කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.
   - I. එස්.වී.කේ.ගයන සිත්මල් (කා.කා.ස) - ප්‍රධාන කාර්යාලය - 2026.02.18-2026.08.17
   - II. එස්.එම්.රශිත සඳුන් ඉෂාර (වැ.ක) - විදුලි අංශය - 2026.03.29-2026.09.28
   - III. අයි.එන්.එම්.පුෂ්පකුමාර ප්‍රනාන්දු(වැ.ක) - ආදායම් අංශය - 2026.02.18-2026.08.17
   - IV. අයි.පී.ප්‍රසාද් සංජීව (සෞ.ක) - කිරිමැටියාන උප කාර්යාලය- 2026.03.26-2026.09.25
   - V. ඒ.ඒ.සුගත් චමින්ද (සෞ.ක) - ප්‍රධාන කාර්යාලය - 2026.03.16-2026.09.15

2) මැ/කිරිමැටියාන ආයුර්වේද වෛද්‍ය නිල නිවාසය පිහිටි රජයට අයත් ඉඩම පවරා දීම සඳහා එකඟතාවය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රි ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

3) 2026 වර්ෂය සඳහා පුස්තකාල මඟින් ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන් සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රි කේ.බී.වරුණ පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

මහ සභාව
2026.01.13

| කිරිමැටියාන මහජන පුස්තකාලය | | |
|---|---|---|
| අනු අංකය | වැඩසටහන | මුදල |
| 1 | ගෘහස්ථ පුස්තකාලය තේරීමේ තරඟය | 20,000.00 |
| 2 | පාඨක නිර්මාණ ප්‍රදර්ශනය | 25,000.00 |
| 3 | වෙසක් ඇරයුම්පත් ප්‍රදර්ශනය | 5,000.00 |
| 4 | ළමා දිනය සැමරීම | 20,000.00 |
| 5 | සමාජ මාධ්‍ය නිවැරදි භිවතය පිළිබඳ දැනුවත් කිරීම | 10,000.00 |
| 6 | ළමා අපචාර හා හිංසනයක් පිලිබඳ දැනුවත් කිරීම | 15,000.00 |
| 7 | කාන්තා දින පුහුණු | 10,000.00 |
| 8 | පරිගණක හා තොරතුරු තාක්ෂණ වැඩසටහන් | 10,000.00 |
| 9 | සා.පෙළ/උ.පෙළ සම්මන්ත්‍රණය | 20,000.00 |
| 10 | ගෙවතු වගා පිලිබඳ දැනුවත් කිරීම | 5,000.00 |
| 11 | වසරේ ක්‍රියාකාරි පාඨකයන් ඇගයීම | 10,000.00 |
| 12 | නව නිපැයුම් තරඟ | 5,000.00 |
| 13 | වාර්ෂික සඟරාව | 10,000.00 |
| 14 | සාහිත්‍ය තරඟ පැවැත්වීම | 5,000.00 |
| 15 | සිංහල අවුරුදු චාරිත්‍ර පිලිබඳ දැනුවත් කිරීම හා ළමා බක් මහ උලෙල | 20,000.00 |
| 16 | දරුවන් සඳහා ටැබ් භාවිතය තුලින් ඉගෙන ගනිමු වැඩසටහන | 5,000.00 |
| 17 | මහක්‍රොබිට් වැඩසටහන පැවැත්වීම | 5,000.00 |

| කහටවිලවත්ත මහජන පුස්තකාලය | | |
|---|---|---|
| අනු අංකය | වැඩසටහන | මුදල |
| 1 | නිදහස් දිනි සැමරුම | 5,000.00 |
| 2 | කාන්තා දිනයට සමගාමීව පවත්වනු ලබන මනෝ විද්‍යා දේශනය | 10,000.00 |
| 3 | පරිසර දින වැඩසටහන | 15,000.00 |
| 4 | අලුත් අවුරුදු චිත්‍ර තරඟය | 10,000.00 |
| 5 | වෙසක් ඇරයුම්පත් තරඟය | 12,000.00 |
| 6 | විශ්ව. අව්වායක එල්ලේ තරඟය | 10,000.00 |
| 7 | සෞඛ්‍ය පිළිබඳ තරුණ දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන | 5,000.00 |
| 8 | ළමා පාඨකයින් සඳහා පවත්වනු ලබන සරුංගල් තරඟය | 12,000.00 |
| 9 | දරුවන්ගේ දක්ෂතා ඇගයීමේ වැඩසටහන | 10,000.00 |
| 10 | පුස්තකාල සේවය සම කියවීමේ රටියේ ඇති වැදගත්කම ගැන අත්පත්‍රිකා බෙදා දීම | 6,000.00 |
| 11 | සාහිත්‍ය මාසයට අදාලව පවත්වනු ලබන දේශනය | 10,000.00 |
| 12 | නත්තල් කැරොල් වැඩසටහන | 8,000.00 |
| | මුළු මුදල | 113,000.00 |

| අනු අංකය | මාසය | වැඩසටහනේ නම | මුදල |
|---|---|---|---|
| 01 | පෙබරවාරි | කතන්දර පැය වැඩසටහන 2026 වර්ෂයට ආරම්භ කිරිම මාසිකව | 2000.00 |
| 02 | මාර්තු | කාන්තා දිනයට සමගාමීව පබළු අත් බෑග් නිර්මාණය කිරීමේ වැඩමුළුව | 5000.00 |
| 03 | අප්‍රියල් 02 | ලෝක ළමා පොත් දිනය වෙනුවෙන් කතන්දර පැය වැඩසටහනට සහභාගි වන දරුවන්ට කතන් දර පොත් ලබා දීමේ වැඩසටහන | 3000.00 |
| 04 | අප්‍රියල් | ප්‍රාදේශීය සභා කාර්ය භාරය ගැන දැනුවත් කිරීමේ දේශනයක් | 5000.00 |
| 05 | මැයි | වෙසක් උත්සවය නිමිති කොට ගෙන වෙසක් කූඩු ප්‍රදර්භනය හා සුභ පැතුම් පත් නිර්මාණ තරඟය | 4000.00 |
| 06 | ජුනි | පොසොන් පොහොය නිමිති කොට ගෙන දරුවන්ට ‘හොඳ දේ කියා දෙමු ‘ තේමා කර ගනිමින් මා පිය වන්දනා කාව්‍ය බණ වැඩසටහන(දූම්මලදෙණිය බෞද්ධ පාසැල) | 3000.00 |
| 07 | ජුලි | ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණය | 10000.00 |
| 08 | අගෝස්තු12 | යොවුන් දිනය සමගාමී කර ගනිමින් නව යොවුන් සිසුවියන් සඳහා යෞවනත්වය සම්බන්ධව පවතින ගැටළු නිරාකරණය ට උපදෙස් ලබා දීමේ වැඩසටහන | 7000.00 |
| 09 | සැප්තැම්බර් | සාහිත්‍ය තරගාවලියක් දූම්මලදෙණිය පාසැල තුල පැවැත්විම(චිත්‍ර/අත් අකුරු/රචනා) | 8000.00 |
| 10 | නොවැම්බර් | දියවැඩියාව. හෘද රෝග වැනි බෝ නොවන රෝග වලක්වා ගැනිම පිලිබඳ උපදෙස් ලබා දිමේ වැඩමුළුව සහ අත් පත්‍රිකා බෙදා දිම (ලෝක දියවැඩියා දිනය නිමිත්තෙන් ) | 9000.00 |
| 11 | දෙසැම්බර් | නත්තල් හි අරුත හා නත්තල් පාඨක හමුව | 2000.00 |

| | මහයායවත්ත පුස්තකාලය | |
|---|---|---|
| අනු අංකය | වැඩසටහන | මුදල |
| 1 | කසළ කලමණාකරණය පිළිබඳ දේශනය | 8,000.00 |
| 2 | නිදහස් දිනයට සමගාමී ළමා චිත්‍ර තරඟය | 8,000.00 |
| 3 | කාන්තා දිනයට සමගාමී පැළ බෙදා දීම | 5,000.00 |
| 4 | ළමා කුසලතා හා ආකල්ප සංවර්ධන දේශනය | 10,000.00 |
| 5 | සිංහල අලුත් අවුරුද්දට ගනුදෙනු කිරීම හා පොත් පරිත්‍යාග ලබා ගැනීම | 5,000.00 |
| 6 | වෙසක් දිනයට සමගාමී වෙසක් සුභ පැතුම්පත් තරඟය | 8,000.00 |
| 7 | ළමා හසුරු කුසලතා වර්ධන වැඩමුළුව | 7,000.00 |
| 8 | සාහිත්‍ය මාසයට සමගාමී ප්‍රහේලිකා තරඟය | 10,000.00 |

| ලුණුවිල පුස්තකාලය | | |
|---|---|---|
| අනු අංකය | වැඩසටහන | මුදල |
| 1 | කාන්තා දිනයට සමගාමීව කොන්ඩා කටු සහ පාවහන් සෑදීමේ වැඩමුළුව | 5,000.00 |
| 2 | අවුරුදු චාරිත්‍ර යටතේ පොත් ගනුදෙනු කිරීම | 4,000.00 |
| 3 | ලෝක මව්වරුන්ගේ දිනයට සමගාමීව මානසික වෛද්‍ය සායනටක් පැවැත්වීම | 8,000.00 |
| 4 | පරිසර දිනයට සමගාමීව කසළ කලමනාකරණය පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් සහ පැළ බෙදා දීම | 6,000.00 |
| 5 | 6/7/8 ශ්‍රේණි දරුවන් සඳහා නියවීම් සඳවුරක් පැවැත්වීම | 10,000.00 |
| 6 | සාහිත්‍ය මාසයට සමගාමීව ප්‍රහේලිකා තරඟයක් පැවැත්වීම | 7,000.00 |
| 7 | දැනුම මිණුම තරඟය | 7,000.00 |
| 8 | වෛද්‍ය සායනයක් පැවැත්වීම | 8,000.00 |

| බුජ්ජම්පොල පුස්තකාලය | | |
|---|---|---|
| අනු අංකය | වැඩසටහන | මුදල |
| 1 | වොලිබෝල තරඟාවලියක් පැවැත්වීම | 15,000.00 |
| 2 | කාන්තා දින වැඩසටහන | 8,000.00 |
| 3 | ජන ක්‍රීඩා උළෙල | 20,000.00 |
| 4 | පහන් කූඩු නිර්මාණය | 2,000.00 |
| 5 | හසුරු කුසලතා | 2,000.00 |
| 6 | රස වින්දන වැඩසටහන | 10,000.00 |
| 7 | සභරාව හා ළමා පොත් එළිදැක්වීම | 20,000.00 |
| 8 | කතන්දර පැයට සමගාමීව චිත්‍ර තරඟය | 3,000.00 |
| | පාඨක සුහද හමුව | 3,000.00 |

| දන්කොටුව පුස්තකාලය | | |
|---|---|---|
| අනු අංකය | වැඩසටහන | මුදල |
| 1 | පුස්තකාල පාඨකයන්ගේ දේශාභිමාන කවිගීත කෙටිකතා තරඟය | 15,000.00 |
| 2 | කාන්තකා රෝග පිළිබඳ කාන්තාවන් දැනුවත් කිරීම | 10,000.00 |
| 3 | ජන ගී ගායනා තරඟය | 10,000.00 |
| 4 | වෙසක් සුභ පැතුම්පත් නිර්මාණ තරඟය | 8,000.00 |
| 5 | පැල බෙදා දීමේ වැඩසටහන | 20,000.00 |
| 6 | දන්සැලක් පැවැත්වීම | 3,000.00 |
| 7 | යෝගා වැඩසටහන | 10,000.00 |
| 8 | පෝස්ටර් හා බැනර් ප්‍රදර්ශනය | 7,000.00 |
| 9 | ළමා නිවාසට පොත් පරිත්‍යාග කිරීම | 5,000.00 |
| 10 | කැරොල් ගී ගායනය | 10,000.00 |

| වැඩසටහන | මාසය | ඇස්තමේන්තු මුදල රු. ශත |
|---|---|---|
| 01. ලෝක පිළිකා දිනය සහ ලෝක පරිසර දිනයට සමගාමීව කෘතිම රසකාරක වලින් තොර දේශීය ආහාර භාවිතයෙන් නිරෝගීමත් දිවියක් ගත කිරීමට මහ තේමා කරගෙන දේශනයක් පැවැත්වීම. | පෙබරවාරි | 10000.00 |
| 02. ජාත්‍යන්තර කාන්තා දිනය සමරමින් ස්වයං රැකියාවට අත්වැලක් යන්න තේමා කර ගත් වැඩසටහනක් පැවැත්වීම. | මාර්තු | 15000.00 |
| 03. ලෝක සෞඛ්‍ය දිනයට සමගාමීව ස්වභාවික ආහාර රටාව තුළින් බෝ නොවන රෝග වලින් මිදී නිරෝගිමත් දිවියක් ගතකිරීම පිළිබඳ දේශනය සහ යෝග ව්‍යායාම ප්‍රායෝගික වැඩසටහන | අප්‍රේල් | 10000.00 |
| 04. පරිවර්තන යුගයේ සිටින යොවුන් පාසල් දරුවන් සඳහා උපදේශන ලබාදීමේ මනෝවිද්‍යා දේශනය | මාර්තු | 10000.00 |
| 05. සිංහල අලුත් අවුරුද්ද සමරමින් අවුරුදු ක්‍රීඩා උත්සවය/ජන ක්‍රීඩා හා ජන ගී පිළිබඳ ළමා පාඨකයින් දැනුවත් කිරීමේ වැඩසටහන | අප්‍රේල් | 15000.00 |
| 06. මත් ද්‍රව්‍ය හා දුම්වැටි භාවිතයෙන් වන පාරිසරික හා ශාරීරික හානීන් පිළිබඳ සිසුන් දැනුවත් කිරීමේ දේශනය | මැයි | 15000.00 |
| 07. ලෝක පරිසර දිනයට සමගාමීව පරිසරය සංරක්ෂණය කිරීම තුළින් රටක් සංවර්ධනය කිරීම පිළිබඳ ළමුන් දැනුවත් කිරීමේ දේශනය | ජූනි | 10000.00 |
| 08. ලෝක යොවුන් දිනය හා නවෝත්පාදන දිනය සමරමින් නව තාක්ෂණ දැනුම ලබාදීම යටතේ දූරකථන / පරිගණක අලුත් වැඩියාව පිළිබඳ වැඩසටහන | ජූලි | 10000.00 |
| 09. නව තාක්ෂණය හා අන්තර්ජාල භාවිතය තුළින් ළමා ලෝකයට එළඹෙන්නාවූ වාසින් හා ළමා ලෝකයට වන අවාසීන් පිළිබඳ දැනුවත් කරමින් එය ප්‍රයෝජනවත් ලෙස නිවැරදිව භාවිතා කිරීම පිළිබඳ ළමුන් දැනුවත් කිරීමේ දේශනය | ජූලි | 10000.00 |
| 10. අ.පො.ස උ. පෙ හා සා. පෙ. සිසුන් සඳහා" ආතතියෙන් මිදී සැහැල්ලු මනසකින් විභාගය සඳහා මුහුණදෙන්නේ කෙසේද යන්න පිළිබඳ පහදා දීමේ දේශනය | අගෝස්තු | 10000.00 |
| 11. ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණයක් පැවැත්වීම. | අගෝස්තු | 5000.00 |
| 12. අ.පො.ස සා.පෙ. සිසුන් සඳහා ගණිතය/ සිංහල/ ඉංග්‍රීසි සම්මන්ත්‍රණයක් පැවැත්වීම. | සැප්තැම්බර් | 10000.00 |
| 13." මාර්ග නීති පිළිපැදීම තුළින් මාර්ග අනතුරු වලින් වැළකී සිටීම" යන්න තේමා කරගෙන ප්‍රෙද්ශයේ රියදුරන් දැනුවත් කිරීමේ දේශනයක් පැවැත්වීම. | සැප්තැම්බර් | 10000.00 |
| 14. මත්ද්‍රව්‍ය නිවාරණය සහ ළමා අපචාර වැළැක්වීම පිළිබඳ පාසල් ළමුන් දැනුවත් කිරීමේ දේශනයක් පැවැත්වීම. | සැප්තැම්බර් | 7500.00 |
| 15. ජාතික කියවීම් මාසයට සමගාමීව 6,7,8,9 ශ්‍රේණි දරුවන් සඳහා කියවීම් කඳවුරක් සහ ගීත රසවින්දන වැඩසටහනක් පැවැත්වීම. | ඔක්තොම්බර් | 15000.00 |

| | ජංගම පුස්තකාලය | |
|---|---|---|
| අනු අංකය | වැඩසටහන | මුදල |
| 1 | මත්ද්‍රව්‍ය මගින් සිදු වන හානිය පිලිබඳව දැනුවත් කිරීම හා අත්පත්‍රිකා බෙදීම | 7,000.00 |
| 2 | මාර්ග සංඥා හා අනතුරු පිලිබඳ දැනුවත් කිරීම | 5,000.00 |
| 3 | අ.පො.ස උ.පෙළ සිංහල සම්මන්ත්‍රණය | 8,000.00 |
| 4 | කියවීමේ වටිනාකම පිළිබඳ දේශනය හා අත්පත්‍රිකා බෙදා දීම | 7,000.00 |
| 5 | අ.පො.ස ස.පෙළ සිංහල සම්මන්ත්‍රණය | 8,000.00 |

4) දහම් පාසල් සඳහා ආධාර මුදලක් ලබා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.ඩිහාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මයා විසින් ස්ථිර කරන ලදි.

i. ගොඩැල්ල සා.සෙබස්තියන් දහම් පාසල - ඩෙස්ක් පුටු ලබා දීම සඳහා රු.25,000
ii. මොහොට්ටිමුල්ල ශ්‍රී පුඤ්ඤානන්ද දහම් පාසල - නිල ලාංඡන පැලදවීමේ උත්සවය සඳහා රු.25,000

ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මහතා, එතුමා මොහොට්ටිමුල්ල ශ්‍රී පුඤ්ඤානන්ද විහාරස්ථානයේ දායක සභාවේ සභාපති වන අතර ඉල්ලීම් ලිපියේ ඩෙස්ක් පුටු ලබා ගැනීම නොව නිල ලාංඡන පැලදවීමේ උත්සවයක් පිළිබඳ සඳහන් වී ඇති අතර උන්වහන්සේ විසින් නිල මුද්‍රා සහිතව අත්සන් තැබූ ලිපියක් මගින් නිල ලාංඡන පැලදවීමේ උත්සවයට යම් කිසි ආධාර මුදලක් ලබා දෙන මෙන් ඉල්ලා සිටි බව පවසන ලදි. ඒ අනුව එය පදනම් කරගෙන ඉල්ලීමක් ඉදිරිපත් කල අතර වෙනත් පාර්ශවයක් විසින් ගොස් යම්කිසි දෙයක් ලබාදෙන බවට පැවසුවහොත් ඕනෑම අයෙක් විසින් ඉල්ලීම් ලිපියක් ලබා දෙන බව පවසන ලදි. ඒ අනුව මෙම සිද්ධිය පිළිබඳ විහාරාධිපති ස්වාමින්වහන්සේගෙන් විමසා බලන බව පවසන ලදි. එමෙන්ම විහාරස්ථානයේ නායක හාමුදුරුවන් විසින් යම්කිසි ඉල්ලීම් ලිපියක් ලබා දීමට පෙර දායක සභාව දැනුවත් කරන නමුත් එවැන්නක් සිදු

වී නොමැති බැවින් මේ පිලිබද උන්වහන්සේගෙන් විමසා බලා පිළිතුරක් ලබා දෙන බව පවසන ලදි. එමෙන්ම නිල ලාංඡන පැලදවීමේ උත්සවයට ආධාර මුදලක් ලබා දීම පිළිබදව විහාරස්ථානාධිපති ස්වාමින්වහන්සේ විසින් ලබා දුන් ලිපිය ප්‍රජා සංවර්ධන කමිටුවේ සභාපති ගරු මන්ත්‍රී ඒ.ඒ.වොහාන් සන්දීප් මහතා මහතාට ලබා දුන් අතර වසර අවසානයේ මුදල් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බැවින් මේ පිළිබද තීරණයක් ගැනීමට මෙම ලිපිය මහ සභාවට ඉදිරිපත් කල බව පවසන ලදි. ඒ අනුව ලිපියේ සඳහන් පරිදි වසර අවසානයේ පවත්වන නිල ලාංඡන පැලදවීම් හා ත්‍යාග ප්‍රධානෝත්සවය සඳහා ආධාර මුදලක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා කතා කරමින්, විහාරාධිපති ස්වාමින්වහන්සේ විසින් එතුමාට ලිපියක් යොමු කර ඇති අතර එස්.ඒ.ආර්.ඒ.ජයානන්ද මහතා මැදිහත් වී එම ලිපිය ලබා දී ඇති බව පවසන ලදි. එහෙත් මෙහි මූලික කරුණ වන්නේ එම ස්වාමීන් වහන්සේ විසින් අදාල ලිපිය 2025.11.04 දින ඉල්ලීම් කර ඇති නමුත් එය ප්‍රාදේශීය සභාවට ලැබී ඇත්තේ 2025.11.07 වන දින වූවත් ලේඛනයේ එය සටහන් වී ඇත්තේ 2025.11.13 වන දින බව පවසන ලදි. ඉන්පසු ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මහතා විසින් 2025.11.24 වන දින ප්‍රජා සංවර්ධන කමිටුවට 2වන ලිපියක් ඉදිරිපත් කර ඇති බව පවසන ලදි. එහෙත් ප්රාදේශීය සභාවේ පරිපාලන ක්‍රියාවලියට අනුව ලිපියක් වේලාසන ලැබී ඇත්නම් එය ප්‍රජා සංවර්ධන කමිටුවට ලැබී නොමැත්තේ මන්දැයි සොයා බැලිය යුතු බව පවසන ලදි. එමෙන්ම සියලු ලිපි පිළිබද තමා විසින් සඳහන් කර ඇති අතර ඒ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පරීක්ෂණයක් සිදු කල යුතු බව පවසන ලදි. එමෙන්ම ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මහතා පවසන කරුණු පරස්පරවිරෝධී වන අතර ගරු සභාපතිතුමා පවසන ආකාරයට මේ සම්බන්ධයෙන් න්‍යාය පත්‍රයෙහි තාක්ෂණික දෝෂ ඇත්නම් ඒවා වෙනස් කල හැක්කේ සංශෝධනයක් මගින් පමණක් බව පවසන ලදි. එහෙත් විහාරාධිපති ස්වාමින්වහන්සේ විසින් ඉදිරිපත් කල ලිපිය ප්‍රාදේශීය සභාව තුල තිබෙනවා නම් එයට අනුමැතිය ලබා දිය හැකි බව පවසන ලදි. එමෙන්ම ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සලකා බැලීමටත් මහ සභාවට හැකි නමුත් ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා එයට විරුද්ධ බව පවසන ලදි.

ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා පවසා සිටියේ ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගැටලුවක් පවතින අතර නිල ලාංඡන පැලදවීමකට මුදල් ලබා දෙනවාට වඩා දරුවන්ට ඩෙස්ක් පුටු වැනි ප්‍රයෝජනයක් ඇති දෙයක් ලබා ගැනීමට මුදල් ලබා දීම සුදුසු බවයි.

ඒ අනුව ගරු සභාපතිතුමා විසින් අදාල ඉල්ලීම සම්බන්ධයෙන් විහාරස්ථානාධිපති ස්වාමින්වහන්සේ විසින් විමසීමක් කල යුතු බව පවසන ලදි.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා පවසා සිටියේ අදාල ලිපිය එවූ පුද්ගලයා විසින් එතුමාට ලිපියක් එවා ඇති අතර එම ලිපිය සම්බන්ධයෙන් තොරතුරු විමසීමක් ලෙස ගරු සභාපතිතුමාට සහ ගරු ලේකම්තුමාට ලිපි එවා ඇති බැවින් එම කරුණ පදනම් කරගෙන මෙම ඉල්ලීම් කල බව පවසන ලදි.

ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මහතා පවසා සිටියේ විජයගම ජනපදයේ ප්‍රජා ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධයෙන් දිගින් දිගටම ඉල්ලීම් කලත් කාර්මික කමිටුව තුල වෙනත් පුද්ගලයෙක් ඉදිරිපත් කල ඉල්ලීමක් ලෙස මෙම යෝජනාව ඉදිරිපත් කර ඇති නමුත් තමා විසින් ඉදිරිපත් කල ඉල්ලීම පිලිබඳ සලකා බලා නොමැති බව පවසන ලදි. එලෙස කිරීමෙන් විපක්ෂයේ මන්ත්‍රීවරු අපහසුතාවයට පත් වන බැවින් ඒ පිලිබඳ කණගාටුව ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රී ඒ.ඒ.වොහාන් සන්දීප් මහතා කතා කරමින්. පන්සල් හෝ පල්ලි වල විහාරාධිපතිවරුන් සහ පියතුමන්ලා ඉල්ලීම් ලිපි ලබා දී කෙටි කාලයක් තුල අදාල මුදල් බලාපොරොත්තුවෙන් සිටියත් එම මුදල් අනුමත කර ගැනීමට දීර්ඝ ක්‍රියාවලියක් ඇති අතර දෙසැම්බර් මස පැවැත්වෙන උත්සවයකට නොවැම්බර් මස තුල ඉල්ලීම් කල පමණින් මුදල් ලබා දීමට හැකියාවක් නොමැති අතර අදාල ඉල්ලීම් ලබා දීමේදි ඒ සඳහා වැය

වන කාල වකවානුව පිළිබඳ අවබෝධයක් ඇතිව කටයුතු කරන ලෙස මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටි අතර එසේ නොමැති වුවහොත් ප්‍රාදේශිය සභාව අපහසුත්වයට පත් වන බව පවසන ලදි.

ගරු සභාපතිතුමා පවසා සිටියේ ගරු මන්ත්‍රී ඒ.ඒ.වොහාන් සන්දීප් මහතා විසින් ඉදිරිපත් කල යෝජනාව ඉතා හොඳ වන අතර විටින් විට ඉල්ලීම් ඉදිරිපත් නොකර ක්‍රමවත්භාවයකින් යුතුව කටයුතු කරන්නේ නම් වැය ශිර්ෂයට අනුව කටයුතු කල හැකි බව පවසන ලදි.

ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මහතා කතා කරමින්, වැසිකිලි ආධාර ලබා දීමෙදි විශාල ප්‍රමාදයක් ඇති අතර එය මහජනතාවට බලපාන ගැටලුවක් බව පැවසූ අතර එමගින් දේශපාලන පක්ෂ නියෝජනය කරන මන්ත්‍රීවරු අහසුතාවයට පත් වන බව පවසන ලදි. ඇතැම් අවස්ථාවලදි රෝගී ආධාර ඉල්ලුම් කලත් එම මුදල අනුමත වී ලැබෙන විට රෝගියා මිය ගොස් සිටීමට පවා පුලුවන් බව පවසන ලදි. වැසිකිලි සම්බන්ද යෝජනාව මහ සභාව තුල අනුමත වී මාස ගණනක් වුවත් එම ආධාර තවමත් අදාල ජනතාවට ලැබී නොමැති බව පවසන ලදි. දේශපාලන කෝණයකින් නොබලා මෙය මහජනයාට සිදු කරන සේවාවක් ලෙස සලකා කටයුතු සිදු කල යුතු බව පවසන ලදි. එමෙන්ම මේ පිළිබඳ කොමසාරිස් කාර්යාලයෙන් විමසූ සැම මොහොතකම ඔවුන් පවසා ඇත්තේ ප්‍රාදේශිය සභාවෙන් ලිපි සකස් කර එවූ විගස ඔවුන් අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන බවයි. මෙහිදි නිලධාරියාට දොස් පැවරිය නොහැකි අතර සිදු කල යුත්තේ වරද සිදු වී ඇති තැන සොයාගෙන නිවැරදි කිරීම බව පවසන ලදි. එමෙන්ම මිනිසුන් අසන ප්‍රශ්න වලට පිළිතුරු ලබා දීමේදි මන්ත්‍රීවරු අසරණ වන බැවින් මේ පිළිබඳව පෞද්ගලිකව හෝ මැදියත් වී නිශ්චිත කාල සීමාවක් ප්‍රකාශ කරන ලෙස පවසා සිටින ලදි. එමගින් ජනතාව දැනුවත් කිරීමට හැකි වන බැවින් එමගින් කිසිදු අයෙක් අපහසුතාවයට පත් නොවන බව පවසන ලදි. ජනතාවගේ බදු මුදල් වලින් මන්ත්‍රීවරු 44 දෙනාම වැටුපක් ලබන බැවින් ඒ සැම මුදලක්ම ජනතාවගේ මුදල් බව පවසන ලදි. එමෙන්ම ණය මුදලක් ලබා ගැනීමට වීදි රේඛාවක් ලබා ගැනීමේදි එම කටයුත්ත සඳහාද දින ගණනාවක් ගත වන බැවින් මහජනතාව අපහසුතාවයට පත් වන බව පවසන ලදි. මන්ත්‍රීවරු පැමිණීමට පෙර ප්‍රාදේශිය සභාවේ වැඩකටයුතු හොඳින් සිදු වී ඇති අතර මන්ත්‍රීවරු 44 දෙනා පැමිණීමෙන් පසු වැඩකටයුතු අකාර්යක්ෂම වී ඇති බව පවසන ලදි. ඒ අනුව ඉහත කරුණු සම්බන්ධයෙන් සලකා බලන ලෙස ඉල්ලා සිටින ලදි.

ගරු සභාපතිතුමා කතා කරමින්, ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මහතා කතා කරන විට අතීත සිද්ධීන් රාශියක් සිහිපත් වූ අතර නවක මන්ත්‍රීවරු ලෙස පැමිණ මෙලෙස ජනතාවගේ ගැටලු පිළිබඳ කතා කිරීම පිළිබඳ සතුටු වන බව පවසන ලදි. එකල විපක්ෂ නායක වූ සරත් බරම්පොල මහතාගේ හෘද සැත්කම වෙනුවෙන් මහ සභාව තුල අනුමැතිය ලබා ගෙන එම ලිපි ලේඛන කුරුණෑගලට යවා අනුමත කර ගැනීමට වසරක පමණ කාලයක් ගත වූ අතර ගරු සභාපතිතුමාගේ හෘද සැත්කම වෙනුවෙන් කතා කිරීමට සරත් බරම්පොල මහතාටද සිදු වූ බව පවසන ලදි. නමුත් එකල එම මුදල් ලබා දීමට දීර්ඝ කාලයක් ගත වූ බවද පවසන ලදි. ඇතැම් නීතිවල බාධාවක් ඇති බැවින් ඒවා වෙනස් කිරීමට පළාත් පාලන පණත මේ වන විට පාර්ලිමේන්තුවට යොමු කර ඇති අතර, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවටද යොමු කිරීමට ඇති බැවින් පණත් 37ක් පාර්ලිමේන්තුවට යොමු කිරීමට නියමිතව ඇති බව පවසන ලදි. එමෙන්ම එම පණත් ඇතුලේ පළාත් පාලන පණතද ඇති බව පවසන ලදි. එමෙන්ම හොරු ඇල්ලීමට සහ යල්පැනගිය අණපනත් වෙනස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව පවසන ලදි. එමෙන්ම 1987 පණතෙහි තිබු දඩ මුදල් දශක 07ක් මුළුල්ලේ වෙනස් නොකලේ මන්දැයි විමසන ලදි. ඒ සඳහා හිටපු රජයට උවමනාවක් නොතිබුනු නමුත් වර්තමාන ආණ්ඩුව විසින් ඒ සැම දෙයක්ම වෙනස් කිරීමට නියමිතව සිටින බව පවසන ලදි. එමෙන්ම ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මහතා ඉදිරිපත් කල ප්‍රශ්න සම්බන්ධයෙන් එකල සිටි නායකයින් වෙත ගොස් විමසන ලෙස පවසන ලදි. මේ වන විට දැවැන්ත වැඩ කොටසක් ඇති අතර ප්‍රාදේශිය සභාව තුල නිසි දත්ත පද්ධතියක් නොමැති බැවින් දත්ත නැවත රැස් කරමින් ඉදිරියට යාමට සිදු වී ඇති බව පවසන ලදි. එමෙන්ම ඔප්පු සඳහා නිල මුද්‍රා තැබීමේ චක්‍රලේඛය 2022 වර්ෂයේ සිට පැවති අතර එය නව ක්‍රමයක් නොවන බව පවසන ලදි. එහෙත් දිගින් දිගටම කල ඉල්ලීම මත මේ වන විට එම කටයුත්ත හලාවතට ගොස් සිදු කිරීමට හැකියාවක් ආණ්ඩු පක්ෂය බලයට පැමිණි මාස 06 තුල ජනතාවට උදා කර දුන් බව පවසන ලදි. එමෙන්ම වැසිකිලි ආධාර ආණ්ඩුව බලයට පත් වී විගසම ලබා දීමට සිදු වූයේ මන්දැයි

කල්පනා කර බලන ලෙස පවසන ලදි. එනම් දශක 07ක් මුළුල්ලේ මිනිසුන් වැසකිලියක් නොමැතිව සිටි නමුත් ඉදිරි වසර 04 සම්පූර්ණ වන විට බල ප්‍රදේශයේ කිසිදු මනුස්සයෙකුට වැසිකිල්යක් නොමැතිව සිටීමට ඉඩ නොතබන බව පැවසූ අතර දශක 70 මුළුල්ලේ මිනිසුන්ට වැසිකිලියත් නොමැති වීම කෙරෙහි ලැජ්ජා විය යුතු බව පවසන ලදි. එම නිසා සියලු යෝජනා සලකා බලා ක්‍රමවත්ව වැඩකටයුතු සිදු කරමින් පවතින අතර පක්ෂ භේදයක් නොමැතිව මිනිසුන්ට සේවය සලසන බව පවසන ලදි. යම් අතපසුකම් වී ඇත්නම් ඒවා නිවැරදි කර ගැනීමට කටයුතු කරන නමුත් විපක්ෂයේ මන්ත්‍රීවරුන් ව්‍යාංගාර්ථයෙන් පවසනුයේ ඔවුන් විසින් ඉදිරිපත් කරන යෝජනා යටපත් කර ආණ්ඩු පක්ෂයේ යෝජනා පමණක් ක්‍රියාත්මක කරන බව වුවත් එවැන්නක් සිදු නොවන අතර, පක්ෂ විපක්ෂ භේදයක් නොමැතිව ලැබෙන සියලු යෝජනා සලකා බලන බව පවසන ලදි.

ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මහතා පවසා සිටියේ ජනතාවට සිදුවන අපහසුතාවය පිළිබඳ කරුණු ඉදිරිපත් කල අතර 2017 දේශපාලනයෙන් සමුගෙන නැවත 2025 ප්‍රාදේශය සභා ඡන්දයෙන් මනාප ලබා ගනිමින් මන්ත්‍රීවරයෙකු ලෙස පැමිණ සිටින බව පවසන ලදි. දේශපාලන නායකයෙකු වෙනුවෙන් කිසිදු අවස්ථාවක පෙනී නොසිටින අතර ජනතාව වෙනුවෙන්ම පමණක් පෙනී සිටින බව පවසන ලදි. එමෙනම් ඉදිරියේදී ගරු සභාපතිතුමාට තමාව සහනයක් විය හැකි මෙන්ම, හිසරදයක්ද විය හැකි නමුත් කිසිදු අවස්ථාවක ජනතාව වෙනුවෙන් සිදු කරන සටන නොනවත්වන බව පවසන ලදි. එමෙන්ම ඕනෑම අවස්ථාවක ගරු සභාපතිතුමාට සහය වන අතර නොහැකිම වුවහොත් මාධ්‍ය හමුවක පෙනී සිට හෝ ජනතාවට අවශ්‍ය සේවාව ලබා දෙන බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මහතා කතා කරමින්, ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මහතා විසින් ඉදිරිපත් කල කරුණු සම්බන්ධයෙන් ස්තූතිය පුද කල අතර ගරු සභාපතිතුමා විසින් 1987 පණත සංශෝධනය නොවීම පිළිබඳ දෙවරක්ම චෝදනා කල නමුත් එකල නවක මන්ත්‍රීවරුන් නොසිටි බැවින් වර්තමානයේ පාර්ලිමේන්තුවේ 159 ක බලයක් ඇති හෙයින් මිනිසුන් තම ඡන්දය ලබා දී ඇත්තේ අඩුපාඩු සැදීමට බව පවසන ලදි. එම නිසා පැරණි චෝදනා වලින් ඵලක් නොමැති අතර නව යෝජනා සෑම විටම ඉදිරිපත් කරන අතර ඒවා ක්‍රියාත්මක වීම කාලය විසින් තීරණය කරනු ඇතැයි පවසන ලදි. එමෙන්ම කිසියම් හෝ අවස්ථාවක ආණ්ඩු පක්ෂයට සහය ලබා දී නොමැති නම් එවැනි අවස්ථාවක් පෙන්වා දෙන ලෙස පවසන ලදි. එමෙන්ම පැරණි නායකයින්ට චෝදනා කිරීමෙන් ඵලක් නොමැති අතර නවක විපක්ෂ මන්ත්‍රීවරු පැමිණ සිටින්නේ නව අදහස් ලබා දීමට බව පවසන ලදි. එම අදහස් හා යෝජනා ක්‍රියාත්මක කිරීමට හැකි නම් ඒවා කරන ලෙසත්, ඒවා කිරීමට නොහැකි නම් කිසියම් දිනක තම පක්ෂය බලයට පැමිණි දිනක එම යෝජනා අදාල මන්ත්‍රීවරුන් විසින් ඉටු කරනු ඇතැයි පවසන ලදි. එමෙන්ම මීට වඩා සේවයක් පෞද්ගලිකව මිනිසුන්ට ලබා දිය හැකි අතර වරදක් අඩුපාඩුවක් පෙන්වා දුන් අවස්ථාවක කේන්ති නොගෙන අදාල කරුණ වැරදි ආකාරයෙන් වටහා නොගෙන ඉදිරියට යා යුතු බව ගරු සභාපතිතුමාට පවසන ලදි.

ගරු සභාපතිතුමා පවසා සිටියේ බල්ලා  විසින් නැට්ට වනනවාද නැතහොත් නැට්ට විසින් බල්ලා වනනවාද යන්න සිතාගත නොහැකි බවයි. ඇතැම් කරුණු අදාල නැතැයි ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මහතා විසින් පැවසුවත් ඔවුන්ට මන්ත්‍රීධුරය ලැබී ඇත්තේ ඔවුන්ගේ පක්ෂයෙන්ම බව පවසන ලදි. එවිට පක්ෂය නොසලකා කටයුතු සිදු කල නොහැකි බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මහතා පවසා සිටියේ පක්ෂ නායකයා ලෙස චිත්‍රාල් මහතා සිටියත් ඇතැම් අවස්ථාවලදි තමා කතා කරනුයේ චිත්‍රාල් මහතා පවසන දෙයම නොවන අතර සෑම විටම ස්වාධින අදහස් ඉදිරිපත් කරන බවයි. එමෙන්ම ඕනෑම අවස්ථාවක ඍජුවම චිත්‍රාල් මහතාටද ඕනෑම දෙයක් පැවසීමට හැකි අතර කිසිදු ලාභ ප්‍රයෝජන බලාපොරොත්තුවෙන් දේශපාලනයට නොපැමිණි බව පවසන ලදි.

ගරු සභාපතිතුමා කතා කරමින්, පොහොසත් රටක් ලස්සන ජීවිතයක් යනුවෙන් ප්‍රතිපත්ති ප්‍රකාශනයක් සකසා ඇති අතර  එය ගරු ජනාධිපතිවරයාගේ සිට ප්‍රාදේශිය සභාවේ සෑම මන්ත්‍රීවරයෙක් දක්වාම එම ප්‍රතිපත්තියට අනුව කටයුතු කරන බව පවසන ලදි. ආණඩු පක්ෂයේ සහ විපක්ෂයේ වෙනස එය බව පවසන ලදි.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා කතා කරමින්, තේ සංග්‍රය භුක්ති විද, වායු සමීකරණය තුල නිදා ගැනීමට මහ සභාවට නොපැමිනෙන අතර මහජනයාට සේවය කිරීමට අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

ගරු මන්ත්‍රී ඞී.මලිත් සමීර පෙරේරා මහතා පවසා සිටියේ පොහොසත් රටක් ඇති කිරීමට නව අදහස් ලිඛිතව ලබා දී මන්ත්‍රීවරයාගේ නිල මුද්‍රාව අත්සන් කොට ලබා දුන් නමුත් මාස 05ක් යනතුරුවත් කාරක සභාවට යොමු නොවීම ගැටලුවක් බව පවසන ලදි.

ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා කතා කරමින්, සරත් බරම්පොල මහතාගේ සහ ගරු සභාපතිතුමාගේ හෘද සැත්කම කිරීමට ආධාර මුදල් ඉල්ලා සිටි මොහොතේ නීත්‍යානුකූල මුදල රු.25,000ක් වුවත් එලෙස ලබා නොදී රු.50,000 බැගින් දෙදෙනාටම ලබා දීමට තීරණය කර බව පවසන ලදි. නීත්‍යානුකූල මුදල අභිබවා ගොස් වැඩි මුදලක් ලබා දීමට තීරණය කල නිසා එම ආධාර මුදල් ලබා දීමට කල් ගතවූ බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ඞී.මලිත් සමීර පෙරේරා මහතා විසින් අදාල මුදල් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අනුමත වී එන තෙක් සභා අරමුදලක් පිහිටුවා අවශ්‍යා ආධාර මුදල් ලබා දීමට ක්‍රමවේදයක් සැකසීමට යෝජනා කරන ලදි.

ඒ අනුව ගරු සභාපතිතුමා පවසා සිටියේ මේ පිළිබඳව කාරක සභා තුල දීර්ඝ වශයෙන් කථා කිරීම සුදුසු බවයි.

සෝෂාව

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා පවසා සිටියේ යම් පුද්ගලයෙක් මඟින් සියලුම නීති පිළිබඳ සොයා බැලු අතර එම නීති වලට අනුව කිසියම් පාර්ශවයක් විසින් ලිපියක් ලබා දී තිබියදිත් එය සලකා බලා කටයුතු සිදු කර නොමැති නම් එහි චෝදනාව එල්ල වන්නේ ප්‍රාදේශිය සභාවටම වන බවයි. එම කටයුතු සිදු නොවන්නේ නම් වගකීම හෝ නීතිමය කරුණු දන්වා ඉහළ අධිකරණයන් වෙත දැන්වීමට අවස්ථාව ඇති බවද පවසන ලදි.

ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය කතා කරමින්, ආධාර ඉල්ලා ඉදිරිපත් කරන ලිපි ලැබුනහොත් ඒවා ප්‍රජා සංවර්ධන කාරක සභාවට යොමු කරන ලෙස ඉල්ලා සිටි අතර එමගින් පක්ෂ විපක්ෂ සියලු දෙනාටම සාකච්ඡා කර තීරණය ගැනීම පහසු වන බව පවසන ලදි.

මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

5) සරණි ගොවි කාන්තා කෘෂි ව්‍යවසායක සමිතියට බදු දී ඇති වෙන්නප්පුව වෙළඳ සංකීර්ණ කඩ කාමරයේ බදු කාලය මාස 06ක් දක්වා දීර්ඝ කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රිනී වයි.ටෙක්ලා ජයම්පති විජේසේකර මිය විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

6) දංකොටුව වෙළඳ සංකීර්ණයේ ii අදියර උඩු මහල ඉදිරිපස වීදුරු කඩ අංක 02 දරණ කඩ කාමරය හිඟ මුදල් අයකරගෙන වසර 03කට එම්.ජේ.ඞී ප්‍රනාන්දු පුල්ලේ මහතා වෙත බදු දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

7) එස්.එම්.ජීවන් සිල්වා මහතා වසින් බදුගෙන ඇති වෙන්නප්පුව බස් නැවතුම්පොල පළමු අදියර පිය ගැට පෙල අසල තාවකාලික කඩ කාමරයේ බදු කාලය නව තක්සේරුවක් යටතේ ඇති වසර 03කට දීර්ඝ කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

මේ පිළිබඳ පැහැදිලි කිරීමට ලේකම් තුමාට අවස්ථාව ලබා දීම සඳහා මහ සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීමට ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු ලේකම් මහතා විසින් අදාල කරුණු පැහැදිලි කරන ලදි. නැවත කාරක සභා අවස්ථාව මහ සභා අවස්ථාවක් බවට පත් කිරීම සඳහා ගරු මන්ත්‍රී සී.ජුඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මහතා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි.

8) ගැසට් පත්‍රයේ සඳහන් මාර්ග තොරතුරු සංශෝධනය කිරීමට අදාල යෝජනාව හා මාර්ග සභාව වෙත පවරා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

**<u>දිග සංශෝධනය වන මාර්ග නාම ලේඛණය</u>**

| අනු අංකය | මාර්ගයේ අංකය | මාර්ගයේ නම | අධිකාරිය | මතුපිට ස්වභාවය | ආරම්භක ඛණ්ඩාංකය වම | ආරම්භක ඛණ්ඩාංකය දකුණ | අවසාන ඛණ්ඩාංකය වම | අවසාන ඛණ්ඩාංකය දකුණ | මාර්ගයේ දිග (මීටර්) | මාර්ගයේ පළල (මීටර්) | සංවර්ධිත පළල (මීටර්) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | NWP WEP C36/30 | මාවතගම ලිහිරියාගම පාර දකුණු පස 19 පාර | ප්‍රාදේශිය සභා | බොරළු | 235366.346/104956.447 | 235365.219/104950.951 | 234918.796/105065.595 | 234920.28/105062.278 | 463.32 | 4.1 | 3.1 |
| 2 | NWP WEP C03/01 | වයික්කාල උතුර ශාන්ත අඩක්කල මාතා මාවත | ප්‍රාදේශිය සභා | බොරළු | 231029.436/98810.323 | 231027.837/98813.296 | 231132.224/98874.753 | 231128.125/98876.919 | 156.46 | 4 | 2.45 |
| 3 | NWP WEP C15/07/01 | කඩවත පාර වම් පස 02 පටුමගේ පළමු අතුරු පාර | ප්‍රාදේශිය සභා | බොරළු | 237060.803/96884.245 | 237061.276/96875.546 | 236976.396/96791.353 | 236977.977/96796.622 | 182.33 | 4.9 | 3.54 |
| 4 | NWP WEP A3/83/02 | දුම්මලදෙණිය නයිනමඩම බෙදුම්පාර වම් පස 07 පටුමග | ප්‍රාදේශිය සභා | බොරළු | 235266.441/97761.121 | 235263.234/97772.104 | 235417.404/97784.325 | 235410.119/97787.973 | 239.04 | 3.95 | 2.47 |
| 5 | NWP WEP A3/08/11 | බටහිර සුසේ පාර වම් පස 07 පටුමග | ප්‍රාදේශිය සභා | බොරළු | 239139.88/ 95660.3 | 239139.56/ 95657.7 | 239134.38/ 95753.91 | 239129.9/ 95754.40 | 114.5 | 4.5 | 3.2 |
| 6 | NWP WEP A3/26 | පැරණි ආර්පිකෝ ෂෝරූම් අසල පාර | ප්‍රාදේශිය සභා | තාර | 238457.14/ 96815.19 | 238461.11/ 96814.33 | 238457.59/ 96677.47 | 238457.76 / 96680.82 | 185.49 | 3.4 | 2.45 |
| 7 | NWP WEP C01/32 | ශා.රීතා විදුහල අසල පාර | ප්‍රාදේශිය සභා | තාර | 235599.62/ 96674.06 | 235605.45/ 96671.6 | 235544.47/ 96497.61 | 235544.35 / 96492.75 | 269.16 | 4.3 | 2.75 |
| 8 | NWP WEP D47/01/07 | ශ්‍රී ධම්මවිජය මාවත දකුණු පස 05 පටුමග | ප්‍රාදේශිය සභා | බොරළු | 231293.6/ 105907.4 | 231294.82/ 105909.25 | 231416.83/ 105767.85 | 231420.94 / 105767.81 | 251.27 | 4.1 | 3 |

**<u>මාර්ග පවරා ගැනීමේ නාම ලේඛණය</u>**

| අනු අංකය | මාර්ගයේ අංකය | මාර්ගයේ නම | අධිකාරිය | මතුපිට ස් | ආරම්භක ඛණ්ඩාංකය වම | ආරම්භක ඛණ්ඩාංකය දකුණ | අවසාන ඛණ්ඩාංකය වම | අවසාන ඛණ්ඩාංකය දකුණ | මාර්ගයේ දිග (මීටර්) | මාර්ගයේ පළල (මීටර්) | සංවර්ධිත පළල (මීටර්) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | NWP WEP B640/C15 | කඩවත පාර පහල කොටස | ප්‍රාදේශිය සභා | තාර | 237089.94/ 95984.57 | 237083.19/ 95985.46 | 237093.51/ 96104.60 | 237086.56 /96106.92 | 124.91 | 6.8 | 3 |
| 2 | NWP WEP A3/26/02 | එලිසබෙත් ප්‍රනාන්දු මාවතේ වම් පස අතුරු මාර්ගය | ප්‍රාදේශිය සභා | බොරළු | 238433.44/ 96682.56 | 238434.94/ 96679.62 | 238397.60/ 96682.54 | 238397.50 /96679.56 | 38 | 3 | 2.5 |

9) කමිටු රැස්වීම වලට සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීමට අදාල යෝජනාව ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

| අ.අ | මන්ත්‍රීවරයාගේ නම | කාරක සභාව/මහ සභාව | දිනය |
|---|---|---|---|
| 1 | ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මහතා | මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව | 2025.12.18 |
| 2 | ගරු මන්ත්‍රී ජගත් කීර්ති කුමාර අබේරත්න මහතා | මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව | 2025.12.18 |
| 3 | ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ආර්.ෂවීන් ප්‍රනාන්දු මහතා | මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව | 2025.12.18 |
| 4 | ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මහතා | මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව | 2025.12.18 |
| 5 | ගරු මන්ත්‍රී එම්.සුරංග රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මහතා | මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව | 2025.12.18 |
| 6 | ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා | මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව | 2025.12.18 |
| 7 | ගරු මන්ත්‍රීනි ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මහත්මිය | මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව | 2025.12.18 |
| 8 | ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා | මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව | 2025.12.18 |
| 9 | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා | මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව | 2025.12.18 |
| 10 | ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා | මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව | 2025.12.18 |
| 11 | ගරු මන්ත්‍රී ජී.ලලිත් ඔස්කා පෙරේරා මයා | කාර්මික සේවා කාරක සභාව | 2025.12.19 |
| 12 | ගරු මන්ත්‍රී එම්.සුරංග රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා | කාර්මික සේවා කාරක සභාව | 2025.12.19 |
| 13 | ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා | කාර්මික සේවා කාරක සභාව | 2025.12.19 |
| 14 | ගරු මන්ත්‍රී ඩබ්.දිනේෂ් සංජීව ප්‍රනාන්දු මයා | පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභාව | 2025.12.18 |
| 15 | ගරු මන්ත්‍රී කේ.එල්.ඩී.ජී.සංජය අප්පුහාමි මයා | පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභාව | 2025.12.18 |
| 16 | ගරු මන්ත්‍රී ජී.ලලිත් ඔස්කා පෙරේරා මයා | පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභාව | 2025.12.18 |
| 17 | ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා | පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභාව | 2025.12.18 |
| 18 | ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා | පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභාව | 2025.12.18 |
| 19 | ගරු මන්ත්‍රී කේ.එල්.සමන් රෝහිත මයා | පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභාව | 2025.12.18 |
| 20 | ගරු මන්ත්‍රිනී එල්.ජයංගා රුවනාරි ප්‍රනාන්දු මිය | පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභාව | 2025.12.19 |
| 21 | ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මයා | පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභාව | 2025.12.19 |
| 22 | ගරු මන්ත්‍රී සුධීර ප්‍රදීප් රණසිංහ මයා | පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභාව | 2025.12.19 |
| 23 | ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා | පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභාව | 2025.12.19 |
| 24 | ගරු මන්ත්‍රී කේ.එල්.ඩී.ජී.සංජය අප්පුහාමි මයා | ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව | 2025.12.22 |

| | | | |
|---|---|---|---|
| 25 | ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය | ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව | 2025.12.22 |
| 26 | ගරු මන්ත්‍රිනී වයි.ටෙක්ලා ජයම්පති විජේසේකර මිය | ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව | 2025.12.22 |
| 27 | ගරු මන්ත්‍රී ජේ.පී.උපාලි සඳසිරි මයා | ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව | 2025.12.22 |
| 28 | ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මයා | ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව | 2025.12.22 |
| 29 | ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මයා | ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව | 2025.12.22 |
| 30 | ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.ෂවීන් ප්‍රනාන්දු මයා | ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව | 2025.12.22 |
| 31 | ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය | ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව | 2025.12.22 |
| 32 | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා | මහ සභාව | 2026.01.13 |
| 33 | ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා | මහ සභාව | 2026.01.13 |
| 34 | ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා | මහ සභාව | 2026.01.13 |
| 35 | ගරු මන්ත්‍රී ඒ.ඒ. විමුත් සුසන්ත අප්පුහාමි මයා | මහ සභාව | 2026.01.13 |

10) බල ප්‍රදේශයේ ජනතාව දැනුවත් නොවීම නිසා අනුමැතියකින් තොරව ඉදි කර ඇති ගොඩනැගිලි හා මායිම් තාප්ප විශාල ප්‍රමාණයක් ඇත. ඒ සඳහා අය කරන දඩ මුදල අඩු කර ජනතාව දැනුවත් කලහොත් අනුමත කර නොගත් එම ඉදි කිරීම් අනුමත කර ගැනීමට ජනතාව උනන්දු වනු ඇත. ඒ නිසා අය කරන දඩ මුදල 2026 වර්ෂය සඳහා සාධාරණ ප්‍රතිශතයකින් අඩු කර ජනතාව දැනුවත් කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී සී.ජූඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැඳී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

මේ පිළිපද අදහස් විමසීමට වැඩ අධිකාරි මහතාට අවස්ථාව ලබා දීම සඳහා මහ සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීමට ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රි කේ.බී.වරුණ පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු වැඩ අධිකාරි මහතා විසින් ඉහත යෝජනාව පිළිබද අදහස් ඉදිරිපත් කරන ලදි. නැවත කාරක සභා අවස්ථාව මහ සභා අවස්ථාවක් බවට පත් කිරීම සඳහා ගරු මන්ත්‍රි කේ.බී.වරුණ පෙරේරා මහතා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රි අයි.පී. ප්‍රගීත් ධර්මජීව මහතා විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව මේ පිළිබඳ වැඩිදුර සාකච්ඡා කිරීමට ඉහත යෝජනාව කාර්මික සේවා කාරක සභාවට යොමු කිරීම සුදුසු වන අතර ඉන්පසු නැවත මීලඟ මහ සභාවට යොමු කිරීම සුදුසු බව යෝජනා කරන ලදි.

11) වෙන්නප්පුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ වෙන්නප්පුව ගමේ පිහිටි ගයාන් ටෙක්ස් අසල මාර්ගය ප්‍රාදේශිය සභා මාර්ගයක් ලෙස NWP/WEP/A3/33 යටතේ ගැසට් කර ඇත. එම මාර්ගයේ පදිංචිකරුවන් විසින් තමන් භාවිතා කරන මෙම මාර්ගය පුද්ගලික මාර්ගයක් ලෙස භාවිතා කිරීමට කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා සිටි. එම මාර්ගය සංවර්ධනය සඳහා වැය කර ඇති මුදල් ගෙවීමට එකඟ වන බවද ප්‍රකාශ කර සිටි. මේ සම්බන්ධයෙන් මෙම අය විසින් මාරවිල දිසා අධිකරණයේ නඩුවක්ද පවරා ඇත. එම නිසා එම මාර්ගයේ අයිතිය අත්හැරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රි කේ.එල්.සමන් රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදි.

ගරු සභාපතිතුමා කතා කරමින්, අදාල මාර්ගය ගැසට් කිරීමට පෙර යම් සිදු වීම පෙලක් පදනම් කරගෙන එම මාර්ගයේ පදිංචිකරුවන් අධිකරණයට ගොස් ඇති බව පවසන ලදි. එහෙත් මෙම මාර්ගය පෞද්ගලික මාර්ගයක් වන බැවින් රජයට ගෙවීමට නියමිත මුදල් ගෙවීමට අදාල පාර්ශවයන් කැමති බව පැවසූ බව පවසන ලදි. ඒ අනුව මේ සම්බන්ධයෙන් කාර්මික සේවා කාරක සභාවේදි නීතිඥතුමා සමඟ සාකච්ඡා කල අතර අදාල පුද්ගලයන්ට සිදු ඇති අසාධාරණය නිසා ඔවුන්ට මෙන්ම ප්‍රාදේශිය සභාවටද නිකරුනේ අධිකරණයට යාමට සිදු වී ඇති බව පවසන ලදි. ඒ අනුව එම මාර්ගයේ සිටින පුද්ගලයන් විසින් මාර්ගය පවරා ගැනීම සම්බන්ධයෙන් රජයට මුදල් ලබා දීමට කැමති නම් එම මාර්ගය ඔවුන්ගේ පෞද්ගලික පරිහරණයට ලබා දීමට කිසිදු බාධාවක් නොමැති අතර එමඟින් ඔවුන් ගොනු කර ඇති නඩුවද ඉවත් කර ගත හැකි බව පවසන ලදි.

ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා කතා කරමින්, මෙය යහපාලන ආණ්ඩු සමයේ වාලට් කුරේ මහත්මියගේ මූලිකත්වයෙන් ඉදිකල මාර්ගයක් වන අතර මාර්ගය සෑදීමට මුදල් ලබා දී ඇත්තේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් බව පවසන ලදි. 2023 වර්ෂයේ එතුමා සභාපතිධුරයට පැමිණෙන විට ඉහත නම් සඳහන් මාර්ගය ඉදි කර තිබූ අතර එවිට නිවාස 03ක් තිබූ බව පවසන ලදි. එම නිවස් 03හි එක් අයෙකුට මාර්ගයෙන් පිවිසුමක් ලබා ගැනීමට අවශ්‍යාව තිබූ නිසා එම මාර්ගය රජයේ මුදල් භාවිතා කර ඉදිකර තිබූ බැවින් එම අවසරය ලබා දුන් බව පවසන ලදි. ඒ අනුව මෙම මාර්ගය පොදු මාර්ගයක් වන අතර එම මාර්ගය පෞද්ගලික මාර්ගයක් වූවා නම් ඒ බව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය දැනුවත් නොකලේ මන්දැයි විමසන ලදි. මෙම ගැටලුව දේශපාලන කෝණයකින් නොබලා සාධාරණ තීරණයක් ගන්නා ලෙස ඉල්ලා සිටින ලදි. මෙම ගැටලුව සම්බන්ධයෙන් එතුමා පෞදලිකව මැදිහත් වී එවකට සිටි ප්‍රාදේශිය ලේකම් තුමියව මුණ ගැසීමට ගොස් සාකච්ඡා කල බව පවසන ලදි. ඒ අනුව මෙම මාර්ගයට තාර දමන මොහොතේ කිසිදු අයෙක් විරෝධතාවයක් එල නොකල බව පවසන ලදි. මේ සම්බන්ධයෙන් ප්‍රාදේශිය සභාවට තීරණයක් ගත නොහැකි අතර, මේ පිළිබඳව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සමඟ සාකච්ඡා කල යුතු බව පවසන ලදි.

උපසභාපතිතුමා කතා කරමින්, අදාල මාර්ගය නිවාස 03කට අයිතිය තිබූ මාර්ගයක් වූවත් එහි කිසිදු අයෙකු මේ සම්බන්ධයෙන් ඉල්ලීමක් කර නොමැති අතර වෙනත් පාර්ශවයක් විසින් අන්තනෝමතික ලෙස කල ක්‍රියාවක් බව පවසන ලදි. ඕනෑම මාර්ගයකට තාර දැමීමේදි කිසිදු අයෙකු අකමැති නොවන අතර එක් පිවිසුම් මාර්ගයක් තිබියදිත් නැවත තාප්පයක් කඩා ඉවත් කර පිවිසුමක් ලබා ගැනීමට අවශ්‍ය නොවන අතර එය පැහැදිලිවම වෙනත් පාර්ශවයක අන්තනෝමතික ක්‍රියාවක් බව පවසන ලදි. එමෙන්ම අදාල මාර්ගය එකල ගැසට් නොවී තිබියදි සභාව සතු මාර්ගයක් ලෙස නම් කල නොහැකි අතර මාර්ගයක් ගැසට් කිරීමට අදාලව මාර්ගයේ පදිංචිකරුවන් විසින් ඉල්ලීමක් කල යුතු බව පවසන ලදි. එලෙස ඉල්ලීමක් නොමැති නම් එම මාර්ගය ඔවුන්ට ලබා දිය යුතු බව පවසන ලදි.

ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය කතා කරමින්, යම්කිසි මාර්ගයක් ප්‍රාදේශිය සභාවට පවරා ගැනීමේදි එහි නීත්‍යානුකූලභාවය පිළිබඳ විමසූ අතර අවම එහයෙන් තිබිය යුතු නිවාස සංඛ්‍යාව පිළිබද විමසා සිටින ලදි.

ගරු සභාපතිතුමා කතා කරමින්, ජයවීදි මාවතේ එක් නිවසක් ඇති මාර්ගයකට කොන්ක්‍රීට් දැමූ අතර එයද දේශපාලන හිතවත්කම් මත පෙර පාලන කාලයේදි සිදු කර ඇති බව පවසන ලදි. එහිදි අනෙක් නිවෙස් හිමියන් විසින් තාප්පය සිදුරු කර කොන්ක්‍රීට් දැමූ මාර්ගයේ තනි නිවස වෙත වැහි ජලය ගලා යාමට සැලැස්වූ මොහොතේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සම්බන්ධීකරණ කමිටුව සමඟ එතුමා එම ස්ථානයට ගොස් නිරීක්ෂණය කල අතර මේ පිළිබඳ විමසා බැලූ බව පවසන ලදි. එහෙත් එම සාකච්ඡාව අවසන් වී පැමිණීමෙන් පසු ප්‍රාදේශිය සභාවේ තාක්ෂණික නිලධාරියෙකු යවා එම සිදුර වසා දමා ඇති බව පවසන ලදි. ඒ අනුව එවැනි සිදු වීම්ද එකල සිදු වී ඇති බව පවසන ලදි.

ඒ අනුව මාර්ගයක් පවරා ගැනීමේ නීතිමය තත්වය පිළිබඳ පැහැදිලි කිරීම සඳහා ලේකම් තුමාට අවස්ථාව ලබා දීමට මහ සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීම සඳහා ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මහතා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.ඩිහාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර

කරන ලදි. ඉන්පසු වැඩ අධිකාරි මහතා විසින් එම නීතිමය තත්වය පිලිබඳ පැහැදිලි කල අතර නැවත් කාරක සභා අවස්ථාව මහ සභා අවස්ථාවක් බවට පත් කිරීම සඳහා ගරු මන්ත්‍රිනී වයි.ටෙක්ලා ජයම්පති විජේසේකර මිය විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි.

ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා පවසා සිටියේ මෙම මාර්ගය පවරා දීමට පෙර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් විමසීමක් කල යුතු අතර අන්තනෝමතික ලෙස කටයුතු නොකරන ලෙසයි.

ගරු සභාපතිතුමා පවසා සිටියේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් අදාල මාර්ගයට තරා දමා ඇත්තේ ප්‍රාදේශිය සභාවෙන් ලබා දුන් ලිපිය පදනම් කරගෙන වන අතර ඔවුන්ගේ ආවරණය එය බව පවසන ලදි. ඒ අනුව ප්‍රාදේශිය සභාව විසින් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය නොමග යවා ඇති බව පවසන ලදි.

ගරු මන්ත්‍රී බී. ඒ.එස්. සාන්ත පෙරේරා මහතා පවසා සිටියේ අදාල මාර්ගය නගර සීමාවේ පිහිටා ඇති අතර අදාල පදංචිකරුවන් එකල අසරණ වී තිබියදි මහ සභාව තුල එකල මෙම ගැටලුව පිලිබඳ සාක්ච්ඡා කලත් වැඩි බලයක් එකල ආණ්ඩු පක්ෂයට තිබු බැවින් එම කටයුත්ත සිදු වූ බව පවසන ලදි.

ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යාලතා මිය පවසා සිටියේ එම මොහොතේ ප්‍රාදේශිය ලේකම් තුමිය වෙත ඉහත මාර්ගය සම්බන්ධයෙන් විරෝධතාවක් ඉදිරිපත් කලේ නම් මේ වන විට ගැටලුවක් නොවන බව පවසන ලදි. එහෙත් එසේ නොකර ගරු මන්ත්‍රී බී. ඒ.එස්. සාන්ත පෙරේරා මහතා නිහඩ වූ බව පවසන ලදි.

ගරු සභාපතිතුමා කතා කරමින්, මාර්ගයක් පවරා ගැනීමේදි ක්‍රමවේදයක් ඇති නමුත් එම ක්‍රියාවලිය සිදු වී නොමැති බව පැවසූ අතර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් එම මාර්ගයට තාර දැමීම සිදු කලත් එක් අයෙකුගෙ උවමනාව මත ඉදිරිපසින් සහ පිටුපසින් ප්‍රවේශය ලබා ගැනීමට සිදු කල ක්‍රියාදාමයක් බව පවසන ලදි. මෙලෙස පෞද්ගලික හිතවත්කම් මත මෙවැනි නීති විරෝදි ලෙස කටයුතු කල මාර්ගයන් තවත් ඇති බව ඉහත යෝජනාව ඉදිරිපත් කරමින් ගරු සභාපතිතුමා පවසන ලදි. ඉහත මාර්ගයට අදාල පාර්ශවකරුවන්ට සිදු වී ඇති අසාධාරණය හේතුවෙන් නඩුවක් ගොනු කර ඇති අතර එම නඩුව නිසා නිකරුනේ ප්‍රාදේශිය සභාවටද එම නඩුවට සම්බන්ධ වීමට සිදු වී ඇති අතර එක් අයෙකුගේ පටු අරමුණක් නිසා සියල්ල සිදු වී ඇති බව පවසන ලදි. ඉහත මාර්ගය අඩි 08ක් පමණ වන අතර අදාල පුද්ගලයාගේ ඔප්පුවෙහි පැහැදිලිවම එම මාර්ගය ඔවුන්ට අයිති බව පෙනෙන බැවින් අදාල මුදල් අය කිරීමෙන් පසු එම මාර්ගයේ අයිතිය අත් හැරීම සුදුසු බව යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රි කේ.එල්.සමන් රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

12) ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මහතාගේ ඉල්ලීම අනුව ගෲප් කැප්ටන් නිර්මාල් සියඹලාපිටිය ගුවන් නියමුවාව සිහි කිරීම සහ ඇගයීම පිණිස කිරිමැටියාන මංසන්ධියේ සමරු ස්මාරකයක් ඉදි කිරීමට එකඟතාවය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

13) ගරු මන්ත්‍රී ජේ.පී.උපාලි සඳසිරි මහතාගේ හෘද සැත්කම සඳහා ආධාර මුදලක් ලබා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදි. ඒ අනුව රු.50,000.00ක මුදලක් ලබා දීමට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.ඩිහාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

**5. කාරක සභා වාර්තා සලකා බැලීම.**

a) 2025.12.18 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව සලකා බැලීම.

ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා විසින් මස් වෙළඳසැල්වල වර්තමාන තත්වය පිළිබඳ විමසන ලදි.

ගරු සභාපතිතුමා පවසා සිටියේ බදු ලබා නොගත් මස් වෙලඳසැල්වල අවම ලංසුව පහත හෙළීම සඳහා මහ සභා තීරණයක් ගත් අතර එය අනුමැතිය සඳහා යවා ඇති බැවින් 2025 ජයග්‍රාහී ලංසුව යටතේ තාවකාලිකව බදු දීමට කටයුතු කර ඇති බව පවසන ලදි.

b) 2025.12.19 දින පැවති කාර්මික සේවා කාරක සභාව සලකා බැලීම.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා කතා කරමින්, මහජන පැමිණිලි පෙත්සම් අංක 03 යටතේ "ගරු මන්ත්‍රිනී එල්.ජයංගා රුවනාරි ප්‍රනාන්දු මිය විසින් ඉදිරිපත් කරන ලද වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවට අයත් උ/බණ්ඩිරිප්පුව කැටේ හංදිය අසල දුම්රිය හරස් මාර්ගය මසඟ වම් පස ඇති මාර්ගයේ මැද සිටුවා ඇති විදුලි කණුව ඉවත් කිරීමට අදාල ලිපිය සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදි. මේ සම්බන්ධයෙන් 2026.01.17 දින පෙ.ව.9.30ට ක්ෂේත්‍ර පරික්ෂායක් කිරීම සුදුසු බව තීරණය විය." යනුවෙන් කාර්මික සේවා කාරක සභාවේ සටහන් වී ඇති බව පවසන ලදි. ඒ අනුව කාර්මික සේවා කාරක සභාවේ සභාපතිවරයා ලෙස ගරු උපසභාපතිතුමා කටයුතු කරන නමුත් මෙම මාර්ගය වෙන්නප්පුව ප්‍රාදේශය සභාවට අයත් මාර්ගයක්ද යන වග සොයා බැලුවේද යන්න විමසන ලදි. ගැසට් පත්‍රයට අනුව දුම්රිය මාර්ගය අසලින් ඇති මාර්ගය NWP/WEP/08/21 යනුවෙන් ගැසට් කර ඇති අතර එම මාර්ගය ප්‍රාදේශිය සභාවට පවර ගන්නා ලෙසට ඔක්තෝම්බර් මාසයේදි ලිපි භාර දී ඇති අතර එම මාර්ගයේ ගමන් ගන්නා නිවැසියන්ගේ අත්සන් ලේඛනයක්ද ඉදිරිපත් කර ඇති බව පවසන ලදි. ඒ අනුව මෙම මාර්ගය වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවට පවරා ගත යුතු අතර සභාවට අයිති නොමැති මාර්ගයක විදුලි පහන් කණුව ගැලවීම ප්‍රාදේශය සභාවට අයත් කාර්යයක් නොවන බැවින් මෙය සොයා බැලිය යුතු බව පවසන ලදි.

ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මහතා කතා කරමින්, ගරු මන්ත්‍රිනී එල්.ජයංගා රුවනාරි ප්‍රනාන්දු මියගේ ඉල්ලීම අනුව ක්ෂේත්‍ර පරික්ෂාවක් සිදු කර ඇති අතර එම පරික්ෂාවට අනුව එහි මාර්ගයක් ඇති බව සොයා ගත් බව පවසන ලදි. ඒ අනුව මාර්ගයන් දෙකක් එකම අසල තිබීමට අවශ්‍ය නොවන බැවින් එක් මාර්ගයක් පමණක් තැබීම සුදුසු බව කාර්මික සේවා කාරක සභාවේ සාකච්ඡා කල බව පවසන ලදි. විදි පහන් කණුව ඉවත් කිරීම පහසු කාර්යයක් නොවන බැවින් එම මාර්ගය සභාව සතු මාර්ගයක් නම් එය එලෙසම භාවිතා කිරීම සුදුසු බව සාකච්ඡා වූ අතර අදාල මාර්ගය ගැසට් වී ඇත්දැයි සොයා බැලිය යුතු බව කාර්මික සේවා කාරක සභාවෙහි සාකච්ඡා කල බව පවසන ලදි.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා කතා කරමින්, NWP/WEP/08/21 යන මාර්ගය පිළිබද ක්ෂේත්‍ර පරික්ෂාව සිදු කලේ එම මාර්ගය ප්‍රාදේශිය සභාවට අයත් මාර්ගයක්ද යන බව නොදැනද යන්න විමසන ලදි. ඒ අනුව ප්‍රාදේශිය සභාවට අයත් නොමැති මාර්ගයකට ගොස් ඇති අතර එය ප්‍රාදේශිය සභාවට අයත් ක්‍රියාවක් නොවන බැවින් ක්ෂේත්‍ර පරික්ෂාව සඳහා වැය වූ මුදල අදාල නිලධාරින්ගෙන් අයකර ගත යුතු අතර ඒ සඳහා ක්‍රියා කරන ලෙස ඉල්ලා සිටින ලදි.

ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මහතා පවසා සිටියේ මන්ත්‍රිවරුන් ලබා දෙන ලිපි පිලිබද සැලකීමක් නොමැති බවට චෝදනා කරන නමුත් අදාල ලිපි පිලිබඳ සොයා බලා කටයුතු කල පසුත් ඒ පිලිබඳ දෝෂාරෝපණ සිදු කරන බැවින් මෙසෙල කටයුතු සිදු කරන්නේ කෙසේද යන්න විමසන ලදි. එමෙන්ම ක්ෂේත්‍ර පරික්ෂාව කිරීමේදි ගරු උපසභාපතිතුමා තමන්ගේ පෞද්ගලික වාහනය භාවිතා කල බවද පවසන ලදි.

සෝෂාව

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා කතා කරමින්, ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කිරීමට ප්‍රථමයෙන් අදාල මාර්ගය ගැසට් වී තිබේදැයි සොයා බැලිය යුතු අතර විදුලි පහන් කණුව ඉවත් කිරීමට සූදානම් වන මාර්ගය සභාවට අයත් මාර්ගයක් නොවන බැවින් ප්‍රථමයෙන් අදාල ලිපි ලබා දී ඒ සම්බන්ධයෙන් මහන්සි වී තිබෙන්නේ තමන් වන නිසාත් එම මාර්ගය සම්බන්ධ වැඩකටයුතු සිදු විය යුත්තේ තමන්ට අවශ්‍ය පරිදි බව පවසන ලදි.

ගරු සභාපතිතුමා පවසා සිටියේ ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතාට කරුණු ඉදිරිපත් කිරීමේදි නිවස සහ මහ සභාව පැටලී ඇති බවයි.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා විසින් සිදු කල ඉහත ප්‍රකාශය වැරදි ප්‍රකාශයක් බැවින් එය ඉල්ලා අස් කර ගනනා බව පවසන ලදි.

ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා කතා කරමින්, නැ/ලුණුවිල ප්‍රතාප් යන අයගේ නිවස අසලම අඩි 10ක් උසට විනීතා ප්‍රියදර්ශනි යන කාන්තාව විසින් තාප්පයක් ඉදි කර ඇති අතර මේ සම්බන්ධයෙන් ප්‍රාදේශිය සභාවට පැමිණිලි කලත් ගරු සභාපතිතුමා විසින් ප්‍රතාප් යන පුද්ගලයාව මාස ගණන් රස්තියාදු කර ඇති බව පවසන ලදි. කිරිමැටියාන තාක්ෂණික නිලධාරියා ගොස් ඒ පිළිබඳ සොයා බැලු නමුත් ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශිය සභාව විසින් නඩු ගොනු කල යුතු වුවත් එවැන්නක් සිදු කර නොමැති බව පවසන ලදි. ඉන්පසු එම පුද්ගලයා විසින් නඩුවක් ගොනු කර ඇති බව පවසන ලදි. එමෙන්ම නීතිඥ විජයන්නද මහතාගේ ලිපිකාරිනිය ලෙස සේවය කරන තැනැත්තියගේ පියා විසින් එම තාප්පය ඉදි කර ඇති බව පවසන ලදි. ඒ අනුව ආණ්ඩු පක්ෂය විසින් වැරදි පූර්වාදර්ශයක් ලබා දෙන අතර ආණ්ඩු පක්ෂය බලයට පත් වී මාස 06ක් ඇතුලත නඩු 02ක්ම ගොනු වී ඇති බව පවසන ලදි. ඒ අනුව එම ඉදි කිරීම අනවසර ඉදි කිරීමක් නම් එය කඩා ඉවත් කල යුතු බව පවසන ලදි. එමෙන්ම දිට්වා සුළි කුණාටුවෙන් පසු ගංවතුර ආපදාවට ලක් වූ ජනතාවට රු.25,000.00ක් ලබා දුන් මොහොතේ අදාල නිවසෙහි කුලී පදනම මත සිටි අයෙක් ජාතික ජන බලවේගයේ ආධාරකාරිනියක් වූ බැවින් රු.50,000.00ක් ගෙවා ඇති බව පවසන ලදි. පසුව නිවසෙහි අයිතිකරුවන් නිවසට ගොස් එහි ඇති අලාභානි පිලිබඳ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට පැමිණිලි කලත් අදාල මුදල් ලබා දීමට ප්‍රමාද කරන බව පවසන ලදි. ඒ අනුව මේ පිළිබඳ සොයා බලන ලෙස ඉල්ලා සිටින ලදි.

ගරු සභාපතිතුමා කතා කරමින්, ඉහත කරුණට සම්බන්ධ වී ඇති නීතිඥවරයා පිළිබඳ පැවසුවහොත් කාරණාව සියලු දෙනාටම පැහැදිලි වන බව පවසන ලදි. අදාල තාප්පය සම්බන්ධයෙන් තාක්ෂණික නිලධාරි මහත්මිය ගොස් පරීක්ෂා කර බලා තාප්පය කැඩීමට අවශ්‍ය ලිපි ලේඛන සියල්ල ඉදිරිපත් කර ඇති බව පවසන ලදි. ඉන්පසු සියලු කටයුතු සූදානම් කර තිබියදි තවත් එක් මාසයක් පමණක් සිටින ලෙස ලිඛිතව 03න් වරක් පමණ දැනුවත් කල බව පවසන ලදි. ඒ අනුව අදාල පියවර ගෙන ඇති බව පවසන  ලදි. මීළඟ මහ සභාවට නීතිඥ මහතාව සම්බන්ධ කිරීමට නියමිත බැවින් එතුමාගෙන් අදාල කරුණු සියල්ල විමසා දැනගත හැකි බව පවසන ලදි. එමෙන්ම අදාල තාප්පයට සම්බන්ධ පාර්ශවයන් තුල ආරවුලක් ඇති අතර කිසිදු අයෙකුව එතුමා පෞද්ගලිකව නොහඳුනන බව පවසන ලදි.

ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය කතා කරමින්, ගොඩැල්ල දේවස්ථානයේ වාර්ෂික මංගල්‍ය පැවැත්වෙන බැවින් වීදි මාර්ගය සුද්ද පවිත්‍ර කරදෙන ලෙස ඉල්ලා කාර්මික හා සේවා කාරක සභාවට යෝජනාවක් ඉදිරිපත් කල අතර ඒ පිලිබඳ සලකා බලා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මහතා කතා කරමින්, පසුගිය ගංවතුර තත්වය නිසා මනන්තුර මාර්ගයේ කොටසක් කැඩී තිබු අතර මේ වන විට එය සාදා තිබුනත් එහි ගැටලුවක් පවතින බව පවසන ලදි. එනම් මෙම මාර්ගය සවස් වරුවක වර්ෂාවක් පවතින මොහොතක සැදු බැවින් ප්‍රිමික්ස් දමා පාර තැලූ විට මාර්ගය මතුපිටට ගම් එකක් සහ වැලි දමා ගොස් තිබු අතර දින ගණනක් ගිය පසු එහි ගල් ගැලවී කොටස් කොටස් දක්නට තිබූ

බව පවසන ලදි. ඉන්පසු මෙම මාර්ගය නිසි අයුරින් සෑදි නොමැති බවට ගම්වාසින් අතර කථාවක් ඇති වූ අතර ආණ්ඩු පක්ෂයේ සංවිධායකයින් පැමිණ මේ පිළිබඳ පැමිණිලි කරන බවට පැවසූ නිසා යමක් සිදු කරයි යන බලාපොරොත්තුවෙන් සිටි බව පවසන ලදි. එහෙත් දිනක් එම මාර්ගය අසලින් ගමන් කරන විට එම මාර්ගයට ප්‍රිමික්ස් දමා තිබූ බව පවසන ලදි. ඒ අනුව මෙම මාර්ගයේ විශාල බර වාහන ගමන් කරන බැවින් එම මාර්ගය ඉක්මනින් කැඩී යන්නේ නම් එහි ගැටලුවක් පවතින බව පවසන ලදි. ඒ අනුව අදාල කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා කර පියවරක් ගන්නා ලෙස ඉල්ලා සිටින ලදි.

ගරු මන්ත්‍රී බී. ඒ.එස්. සාන්ත පෙරේරා මහතා කතා කරමින්, එතුමා පදිංචි ප්‍රදේශයේ අහස්දියවල වත්ත පිහිටා ඇති අතර ලුණුවිල ප්‍රදේශයෙන් භාගයක් පමණ ජල ප්‍රමාණයක් අහස්දියවල වත්තට පිරෙන බව පවසන ලදි. එය මේ වන විට විශාල ගැටලුවක් වී ඇති බැවින් එයට කුමන හෝ විසඳුමක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මහතා පවසා සිටියේ ඒ සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරික්ෂාවක් සිදු කල අතර අදාල නිවැසියන් එම අහස්දියවලවත්ත ඉඩම ඔවුන්ගේ ඉඩමට අයිති කොටසක් බව පවසන අතර එය ඔවුන්ට අයිති වන්නේ නම් එම ඉඩම් කොටස් පොදු එකක් නොවන බව පවසන ලදි. එම නසා ප්‍රථමයෙන් එම ඉඩම ලොදු ඉඩමක්ද නැතහොත් පෞද්ගලික ඉඩමක්ද යන වග සොයා ගත යුතු බවයි.
ගරු මන්ත්‍රී බී. ඒ.එස්. සාන්ත පෙරේරා මහතා පවසා සිටියේ අදාල නිවැසියන්ලේ ඔප්පු පරික්ෂා කර ඉඩම් කොටස මැන බලා වෙන් කිරීම සුදුසු බවයි.

ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මහතා කතා කරමින්, ඇළ මාර්ගය පිළිබඳ අදාල පාර්ශවයන් සමඟ සාකච්ඡා කල මොහොතේ ඔවුන් පවසා සිටියේ ගරු මන්ත්‍රී බී. ඒ.එස්. සාන්ත පෙරේරා මහතා එම ඉඩම් කට්ටි කර විකුණා සියලුම වැටවල් වසා දමා ඇති බව පැවසූ බව පවසන ලදි. ඒ අනුව ඇළ මාර්ගය පරික්ෂා කර බලා සුද්ද පවිත්‍ර කල යුතු බව පවසන ලදි.

ගරු මන්ත්‍රී බී. ඒ.එස්. සාන්ත පෙරේරා මහතා පවසා සිටියේ ලුණුවිල ගඟට යාමට ඇති මාර්ගය අනවසර ආකාරයෙන් අත්පත් කරගෙන සිටින බැවින් ඒ පිළිබඳ සම්බන්ධීකරණ කමිටුවට යොමු කර ඇති අතර ඒ පිළිබඳව සොයා බලා කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

c) 2025.11.20 දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභාව

ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය කතා කරමින්, පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභා වාර්තාවේ ඩබ්.එම්.කේ.රංජිත් කුඤ්ඤගේ අක්කරයක් හා පර්.9.50ක් කැබලි 10කට කැඩීම සම්බන්ධව සඳහන් වී ඇති හෙයින් ඒ පිළිබඳ වැඩ අධිකාරි මහතාගෙන් පැහැදිලි කිරීමක් අවශ්‍ය බව පවසන ලදි. ඒ අනුව ඒ පිළිබඳ පැහැදිලි කිරීමට වැඩ අධිකාරි මහතාට අවස්ථාව ලබා දීම සඳහා මහ සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීමට ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.එල්.සමන් රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන් පසු වැඩ අධිකාරි මහතා විසින් අදාල ඉහත කරුණ පිළිබඳ පැහැදිලි කරන ලදි. ඉන්පසු නැවත කාරක සභා අවස්ථාව මහ සභා අවස්ථාවක් බවට පත් කිරීම සඳහා ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි.

d) 2025.12.18 දින පැවති ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව

ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය කතා කරමින්, මහයායවත්ත පුස්තකාලයේ කාන්තා දිනයට සමගාමීව පැල බෙදා දීමේ වැඩසටහනක් සඳහා රු.5000.00ක් මුදලක් වෙන් කර ඇති නමුත් එම ප්‍රදේශයේ ඇත්තේ පුංචි බිම් කොටසක් බැවින් එමහ බිම් කොටසට සරිලන ආකාරයට මේ වන විට ප්‍රදේශවාසින් පැල සිටුවාගෙන සිටින

බව පවසන ලදි. වත්මන් සමාජය දෙස බැලීමේදි පවුල් සංස්ථාව මේ වන විට බිඳ වැටෙමින් පවතින බවක් පෙනෙන අතර පවුල් සංස්ථාව රැකගන්නා අකාරය පිලිබඳ උදේශනාත්මක වැඩසටහනක් පැවැත්වීම සුදුසු බව යෝජනා කරන ලදි. එමෙන්ම දරුවන්ගේ ආහාර වේලට පුදුමු හිතෙන දේවල් එක් කිරීමට, එනම් ක්ෂණික ආහාර ලබා දීමට මව්වරුන් පුරුදු වී සිටින බව පවසන ලදි. ඒ අනුව කාන්තාවන් කාන්තා දිනයෙහි අර්ථාන්විත බව වැඩි කරමින් පවුල් සංස්ථාව රැක ගන්නා ආකාරය පිලිබඳ දැනුමක් ලබා දීමට අවශ්‍ය බව පවසන ලදි. එමෙන්ම ඇතැම් කාන්තාවන් සෑම විටම ස්වාමිපුරුෂයාගේ වැරදි කියමින් පවුල් වෙන් වන අවස්ථා ඇති නමුත් කාන්තාවන් අතින්ද වැරදු අඩුපාඩුකම් සිදු වන බැවින් එම වැරදි වලින් කාන්තාවන් මුදවා ගැනීම තුලින් පවුල් ජීවිතය රැක ගන්නා ආකාරය පිලිබඳ දැනුවත් කිරීමට වැඩසටහනක් පවත්වනවා නම් පැල් බෙදා දීමට වඩා යෝග්‍ය වන බව යෝජනා කරන ලදි.

එමෙන්ම මේ වන විට දරුවන්ව පාසල් වලට ඇතුලත් කිරීමේදි ඉතා අඩු බවක් පෙනී යන අතර සිංහල ජාතිය අඩු වෙමින් පවතින අතර මේ පිලිබඳ කාන්තාවන් සිතන මානසිකත්වය වෙනස් කිරීම තුලින් දරුවෙකු බිහි කර අපගේ ජාතිය ආරක්සා කල යුතු යැයි යන ආකල්පය ලබා දීමට උපදේශනාත්මක නැඩසටහනත් පැවැත්වීම සුදුසු බව යෝජනා කරන ලදි. ඒ අනුව ප්‍රදේශයේ සමස්ථ කාන්තාවන් එකතු කර ගනිමින් වැඩසටහනක් පැවැත්වීම පැළ ලබා දීමට වඩා සුදුසු බව පවසන ලදි.

ඉනපසු ගරු සභාපතිතුමා විසින් යම් නිවැරදි කිරීමක් සිදු කරන ලදි. එනම් ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තාව පසුගිය මාසයේ එළිදැක්වූ අතර එහි ජාතියෙහි කිසිදු අඩු වීමක් සිදු වී නොමැති අතර එහි අනුපාතය එලෙසම පවතින බව පවසන ලදි. ඒ අනුව මෙය ජාතිවාදයට භාවිතා වූවක් බව පවසන ලදි.

ඒ අනුව ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය පවසා සිටියේ ඔවුන්ට දැනේන ආකාරයට පෙර පාසල් සසදා බැලීමේදි පෙර පාසල් සඳහා ඇතුලත් කරන දරුවන් ප්‍රමාණය මේ වන විට අඩු වී ඇති බවයි. එම නිසා රටක් සෑදීමට ග්‍රාමීය මට්ටමින් මව්වරුන් ද්රිමත් කල යුතු බවත් මව්වරුන්ගේ මානසිකත්වය සෑම දෙයකට බලපාන බවත් පවසන ලදි. එම නිසා වෙන්නප්පු ආසනයේ බදු මුදල වලින් ඉහත වැඩසටහන ක්‍රියාත්මක වන බැවින් එම මුදල් අර්ථාන්විත වැඩකට යොමු කිරීම වැදගත් වන අතර කාන්තවන් වෙනුවෙන් උපදේශනාත්මක වැඩසටහනක් පැවැත්වීම මඟින් පවුල ශක්තිමත් වීම, දරුවන්ගේ පෝෂණ මට්ටම වැඩි වීම සහ මවගේ මනස හොඳ මට්ටමකට පවතාවා ගැනීමට හැකි බව පවසන ලදි. ඉහත යෝජනාවන ලබා දෙනුයේ පුස්තකාල පාලිකාවන් විසින් වන අතර ඔවුන්ද තවම පුහුණු වෙමන් සිටින අය නිසා අදාල යෝජනා පිලිබඳ සොයා බලා අර්තාන්විත දෑ ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින් ලදි.

එමෙන්ම සාහිත්‍ය මාසයට සමගාමීව ප්‍රහේලිකා වැඩසටහනක් පැවැත්වීමට රු10,000.00ක මුදලක් වෙන් කර ඇති අතර ඒ වෙනුවට කාලීන මාතෘකා 02ක් තෝරා ගෙන විවාදයක් පැවැත්වීමට හැකි අතර දැනුම මිනුම තරග සාමුහික තරඟ ලෙස පැවැත්මීව තවත් අර්ථාන්විත වන බව පවසන ලදි.

ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය කතා කරමින්, දංකොටුව පුස්තකාලයට උඩු මහලෙන් පහලට ගෙලන ඒම සුදුසු වන අතර මහළු අය පවා පොත් පරිශීලනයට පුස්තකාලයට යන අතර එය අපහසු බව පවසන ලදි. ඒ අනුව ඉක්මනින් ක්‍රියාත්මක වන පරිදි පුස්තකාලය වෙනත් තැනකට මාරු කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

ගරු මන්ත්‍රී ඒ.ඒ.වොහාන් සංදීප් මහතා පවසා සිටියේ දැනට පවතින තත්වය අනුව වෙනත් බූමියකට පුස්තකාලය රැගෙන යාම අපහසු බවින් වෙළඳ සංකීරණයේම පහළ කොටසේ පුස්තකාලය ස්ථාපිත කිරීමට සාකච්ඡා කල බවයි.

e) 2025.12.18 දින පැවති පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභාව

ගරු මන්ත්‍රී ජී.ලලිත් ඔස්කා පෙරේරා මහතා කතා කරමින්, ධීවර තොටුපලවල් සඳහා විදුලි මීටරයක් සවි කිරීම සම්බන්ධව පොදු පහසුකම් වාර්තාවේ සඳහන් වී තිබු බැවින් එම විදුලි බිල් සහ අලුත්වැඩියා කටයුතු සිදු කරනුයේ ප්‍රාදේශිය සභාවෙන්ද යන වග විමසන ලදි.

ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මහතා ප්‍රකාශ කර සිටියේ මේ සම්බන්ධයෙන් දැරීමට ඇති වියදම හා කාලය ඉතා විශාල බැවින් ප්‍රධාන මාර්ගයේ සිට විදුලි මීටරය දක්වා ප්‍රමාණය විදුලි බල මණ්ඩලයෙන් නඩත්තු වන අතර ඉතිරි ප්‍රමාණය ප්‍රාදේශිය සභාව විසින් නඩත්තු කරන බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ජී.ලලිත් ඔස්කා පෙරේරා මහතා පවසා සිටියේ සැම තොටුපලකටම සීමිත විදුලි පහන් ප්‍රමාණයක් සුදුසු වන අතර වීදි පහන් ආලෝකය අත්‍යවශ්‍යම වන්නේ ගල් වැටිය පෙනෙන ප්‍රමාණයට බව පවසන ලදි.

ඒ අනුව ගරු සභාපතිතුමා පවසා සිටියේ විදුලි බල මණ්ඩලය සමඟ සාක්චිඡා කර ප්‍රථමයෙන් මෙම ක්‍රියාදාමය හදුනාගැනීමක් සිදු කිරීම සඳහා ඉහත කටයුත්ත සිදුකරගෙන යාම සුදුසු බවයි.

f) 2025.12.03, 2025.12.16, 2025.12.19 සහ 2025.12.29 දින පැවති ටෙන්ඩර් කමිටුව

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා පවසා සිටියේ මැක්සිස් ආයතනයේ මෝටරය පිළිබඳ සහා වාර කිහිපයකදීම විමසීම් කලත් තවමත් එහි අගල් ප්‍රමාණය හා නිෂ්පාදිත රට පිළිබඳ සටහන් කර නොමැති බවයි. ඒ අනුව මේ පිලිබඳ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

**6. ආදායම්/වියදම් වාර්තා හා වෙනත් වාර්තා සලකා බැලීම**

a) 2025 නොවැම්බර් මස වියදම් වාර්තාව සලකා බැලු අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

b) 2025 නොවැම්බර් මස ආදායම් වාර්තාව සලකා බැලු අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

c) නොවැම්බර් මස විදුලි පහන් නඩත්තුවට අදාල ප්‍රගති වාර්තාව සලකා බැලු අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

d) නොවැම්බර් මස වාහන ධාවනයට අදාල වාර්තාව සලකා බැලු අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

e) ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගනයේ ගස්වල අතු කැපීම සහ ටිපර් රථය තබ්බෝව ජලාශය පවිත්‍ර කිරීමට යෙදවීම සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් එවා ඇති විමර්ෂණ වාර්තාව සලකා බැලු අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

2026 ජනාවාරි 01 වන දින ප්‍රාදේශිය සඳහාවේ වැඩ කටයුතු ආරම්භ කල අතර ඒ සඳහා අනෙකුත් පක්ෂවල මන්ත්‍රීවරු සහ මන්ත්‍රීවරියන් පැමිණි සිටි අතර එදින වැඩ කටුයුතු සාර්ථක කර ගැනීම සඳහා සියලු දෙනාගෙන්ම ලැබුනු සහයෝගය ඉතා අගය කොට සලකන බව පවසන ලදි. එමෙන්ම කාර්ය මණ්ඩලයේ මහත්ම මහත්මීන්ට ස්තූතිය පුද කල අතර මෙවර උදේ ආහාර මේසය කාර්ය මණ්ඩලයේ මැදිහත්වීම මත සිදු කර සාමුහිකව 2026 වසර ආරම්භ කල අතර සියලු දෙනාටම ඉදිරි වැඩකටයුතු සාර්ථකව සිදු කිරීමට අවශ්‍ය ධෛර්යය ලාබේවායි ප්‍රාර්ථනා කරන ලදි.

එමෙන්ම 2026.01.13 දින මහ සභාවට පැමිණි මාධ්‍යවේදී රවීන්ද්‍ර මහතාටත් නිලධාරි මහත්ම මහත්මීන්ටත්, ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත් ස්තූතිය පුද කරමින්, ගරු සභාපතිතුමා විසින් ප.ව 12.30ට පමණ මහ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

ටී.බී.ඩී ඇන්ටනි කුමාර්
සභාපති,
වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව.